# මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ නායයෑම් අධි අවදානම් කලාපවල ජීවත්වන පවුල් නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතියේ කාර්යසාධනය



වාර්තා අංකය : CLP/L/PA/MDA/2019/115 ශාඛාව - CLP/L

## ජාතික විගණන කාර්යාලය

# පටුන


| | | පිටු අංක |
|---|---|---|
| 1. | විධායක සාරාංශය | 1-2 |
| 2. | වාර්තාවෙහි පසුබිම හා ස්වභාවය | |
| 2.1 | හැඳින්වීම | 3-4 |
| 2.2 | විගණනය සඳහා අධිකාරි බලය | 4 |
| 2.3 | විගණනයේ අරමුණ | 5 |
| 2.4 | විෂය පථය | 5 |
| 2.5 | විගණන නිර්ණායක | 6 |
| 2.6 | සම්බන්ධිත ආයතන | 7-8 |
| 3. | විගණන නිරීක්ෂණ | |
| 3.1 | අවදානම් කලාප හඳුනා ගැනීම හා ක්‍රියාත්මක වීමේ මූලික වැඩපිළිවෙල | 9 |
| 3.1.1 | අවදානම් කලාප හඳුනා ගැනීම අඛණ්ඩව සිදුවීම | 9-10 |
| 3.1.2 | දත්ත හා තොරතුරු පද්ධතිය | 10-11 |
| 3.1.3 | සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම | 11-12 |
| 3.1.4 | මූල්‍ය සැලැස්ම | 12 |
| 3.1.5 | මානව හා භෞතික සම්පත් | 12-14 |
| 3.2 | වැඩසටහනේ ක්‍රියාත්මක අවදිය | 15 |
| 3.2.1 | ව්‍යාපෘතිය ක්‍රියාතමක කිරීම සඳහා අවශ්‍ය කමිටු ස්ථාපිත කර නොතිබීම | 15-18 |
| 3.2.2 | ප්‍රතිලාභීන් හඳුනා ගැනීම හා ලියාපදිංචිය | 18 |
| 3.2.3 | ප්‍රතිලාභීන්/ නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් | 18-19 |
| 3.2.4 | ප්‍රතිලාභීන් සඳහා විකල්ප අවස්ථා හඳුනා ගැනීම හා ප්‍රතිලාභ ලබාදීම | 19-22 |
| 3.2.5 | අධි අවධානම් ප්‍රදේශවල නැවත පදිංචි වීම වැළැක්වීමට පියවර නොගැනීම | 23-25 |
| 3.3 | ව්‍යාපෘතියේ ප්‍රගතිය | 26 |
| 3.3.1 | අරමුදල් උපයෝජනය | 26 |
| 3.3.2 | භෞතික ප්‍රගතිය | 26-28 |
| 3.3.3 | ප්‍රතිලාභියාගේ ජීවන තත්ත්වය | 29 |
| 3.3.4 | වෙනත් නිරීක්ෂණ | 29-30 |
| 4. | නිර්දේශයන් | 31-32 |

## 1. විධායක සාරාංශය

-------------------

නායයෑම් තත්ත්වයන් ඇතිවීම තුළින් 2014 හා 2016 වර්ෂවලදී බදුල්ල හා කෑගල්ල දිස්ත්‍රික්ක තුළ සිදුවූ ජීවිත හානි හා අවතැන් වීම් හේතුවෙන් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය හරහා දිවයිනේ නායයෑම් අධි අවදානම් ප්‍රදේශ හඳුනා ගැනීම හා හඳුනාගත් අධි අවදානම් ප්‍රදේශවල ජීවත්වන පුද්ගලයින් එම ස්ථාන වලින් ඉවත් කර නැවත පදිංචි කිරීමෙන් ජීවිත හානි හා හදිසි සහන සේවා වියදම් අවම කර ගැනීමේ අරමුණින් යුතුව දිස්ත්‍රික් මට්ටමින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ඇත.

2017 වර්ෂයේදී 14860 ක් වූ අධි අවදානම් කළාපවල ජීවත්වන පවුල් සංඛ්‍යාව 2019 වර්ෂයවන විට 15025 ක් දක්වා වර්ධනය වී ඇති අතර, මහනුවර දිස්ත්‍රික්කය තුළ එම සංඛ්‍යාව 1292 සිට 1478 ක් දක්වා වර්ධනය වී ඇත. රු.මිලියන 21,050 ක සමස්ත අයවැයගත වියදමක් යටතේ මෙම ව්‍යාපෘතිය ඉටු කිරීමට අපේක්ෂා කර තිබූ අතර, 2019 සැප්තැම්බර් වන විට රු.මිලියන 2,699 ක් වැයකර තිබුණි. මෙම ව්‍යාපෘතියෙන් ආවරණය වන අධි අවදානම් පවුල් සංඛ්‍යාව වාර්ෂිකව ඉහළ යාම හා ඒ තුළින් සිදුවන සමාජ ආර්ථික ගැටළු සඳහා විසඳුම් නොමැති වීම හේතුවෙන් කාර්යසාධන විගණනය සඳහා මෙම මාතෘකාව තෝරා ගන්නා ලදි.

අධි අවදානම් කළාප හඳුනා ගැනීමේ ක්‍රියාවලිය, නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය සඳහා මාර්ගෝපදේශ සැපයීම හා ආපදා ප්‍රත්‍යාස්ථීතික නිවාස ඉදිකිරීම් සඳහා වූ නිවාස සැලසුම් හා ඉදිකිරීම් පිරිවිතර ඇතුළත් මාර්ගෝපදේශ සැපයීමේ කටයුතු සිදුවී ඇති නමුත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ මට්ටමේදී අපේක්ෂිත ප්‍රගතිය ලබා නොමැති බව නිරීක්ෂණය විය.

මහනුවර දිස්ත්‍රික්කය තුළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පරීක්ෂාවේදී ව්‍යාපෘතියේ ප්‍රගතිය ඉතා අවම මට්ටමක පවතින බව නිරීක්ෂණය විය. ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳව ආපදා කළමනාකරණ අමාත්‍යාංශයෙන් නිකුත් කර ඇති එම මාර්ගෝපදේශය ප්‍රකාරව අවශ්‍ය කමිටු පිහිටුවා නොතිබීමෙන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අදාළවන රාජ්‍ය ආයතන අතර නිසි සම්බන්ධීකරණයක් නොවීම, ප්‍රතිලාභින් ලියාපදිංචි කර ගැනීමේදී මාර්ගෝපදේශයේ උපදෙස් පිළිබඳ අවධානය යොමුකර නොතිබීම, එක් එක් විකල්ප අවස්ථා යටතේ ප්‍රතිලාභ ලබා දීමේදී පසු විපරම් කටයුතු නිසි පරිදි සිදු නොවීම, අපරීක්ෂාකාරී ලෙස මූල්‍ය ප්‍රතිලාභ ගෙවීම, ආපදා සහන

සේවා නිලධාරින් හා ප්‍රතිලාභීන් දැනුවත් කිරීමේ කටයුතු ප්‍රමාණවත් පරිදිසිදුවී නොතිබීම මෙන්ම ඇතැම් ප්‍රාදේශිය ලේකම් බලප්‍රදේශවල රජයේ ඉඩම් නොතිබීම හා තෝරාගෙන ඇති රජයේ ඉඩම්වල යටිතල පහසුකම් සංවර්ධනය නොවීම ව්‍යාපෘතියේ ප්‍රගතිය අවම වීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ක්‍රියාකාරී කමිටුව, පැමිණිලි / අභියාචනා කමිටුව, ඉඩම් හඳුනා ගැනීමේ කමිටුව සහ ප්‍රාදේශිය ලේකම් කාර්යාල මට්ටමින් ප්‍රතිලාභීන් ලියාපදිංචි කිරීමේ කමිටු ක්‍රියාකාරි මට්ටමින් පැවැත්වීම, ප්‍රතිලාභ ලබාදීමේදී මාර්ගෝපදේශයේ උපදෙස් නිසි පරිදි අනුගමනය කිරීම, පසුවිපරම් කටයුතු යාවත්කාලීනව සිදුකිරීම, ප්‍රමාණවත් පරිදි ආපදා සහන සේවා නිලධාරින් ප්‍රාදේශිය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කිරිම හා ප්‍රතිලාභීන් සඳහා රජයේ මැදිහත් වීමෙන් නිවාස හෝ නිවාස සංකීර්ණ ඉදිකිරීම මඟින් වඩාත් සාර්ථකව ව්‍යාපෘතියේ කටයුතු ඉටුකල හැකි බව නිරීක්ෂණය විය.

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා වූ අමාත්‍ය මණ්ඩල තීරණ ප්‍රකාරව අධි අවදානම් ප්‍රදේශවල නැවත පදිංචි වීම වැළැක්වීම සඳහා පියවර ගැනීම, ව්‍යාපෘතියේ ක්‍රියාත්මක අවධියේ ප්‍රගතිය කඩිනම් කිරීම සඳහා වූ සැලසුම් හා ක්‍රමෝපායන් ඇති කිරීම සහ අධි අවදානම් ප්‍රදේශවල පිහිටි වතු නිවාස සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගැනීම කෙරෙහිද අවධානය යොමුවිය යුතු වේ.

## 2. වාර්තාවෙහි පසුබිම හා ස්වභාවය

----------------------------------

### 2.1 හැඳින්වීම

----------

2014 වර්ෂයේදී බදුල්ල දිස්ත්‍රික්කයේ හල්දුම්මුල්ල, මීරියබැද්ද ප්‍රදේශයේ සිදු වූ නායයෑමෙන් පවුල් 88 ක පුද්ගලයින් 321 ක් පිඩාවට පත්ව ඇති අතර, මරණ 37 ක් වාර්තා වී ඇත. එමෙන්ම 2016 වර්ෂයේ මැයි මස කෑගල්ල දිස්ත්‍රික්කයේ ඇති වූ නායයෑම් තත්ත්ව හේතුවෙන් පවුල් 5804 ක පුද්ගලයින් 21334 ක් පීඩාවට පත්ව ඇති අතර පූර්ණ නිවාස හානි 230 ක් හා අර්ධ නිවාස හානි 1845 ක් වාර්තා වී ඇත. තවද, නායයෑම් අවදානම මත පදිංචි ස්ථානයන්ගෙන් ඉවත්කල පවුල් සංඛ්‍යාව 1941 ක් වී ඇත.

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ වාර්තා අනුව 2017 මැයි 31 වන විට මහනුවර දිස්ත්‍රික්කය තුළ අධි අවදානම් ප්‍රදේශ තුළ ජීවත්වන පවුල් 1292 ක් වාර්තා වී ඇති අතර විගණන පරීක්ෂාවන්ට අනුව, 2019 වර්ෂය වන විට එම සංඛ්‍යාව පවුල් 1478 ක් දක්වා වර්ධනය වී ඇත.

ජාතික ගොඩනැගිලිපර්යේෂණ සංවිධානය විසින් හඳුනාගෙන ඇති නායයෑම් අධිඅවදානම් කළාපවල පිහිටා ඇති නිවාස වෙනුවෙන් වෙනත් විකල්ප ස්ථානවල නිවාස ඉදිකිරීමට පියවර ගැනීම මඟින් නායයෑම හේතුවෙන්වන ජීවිත හානි අවම කර ගැනීමට මෙන්ම හදිසි සහන සේවා වෙනුවෙන් රජයට දැරීමට සිදුවන වියදම අවම කර ගැනීමේ අරමුණින් යුතුව දිවයිනේ දිස්ත්‍රික්ක 09 ක් තුළ නායයෑම් අවදානම් හේතුවෙන් තම පදිංචි ස්ථානයෙන් ඉවත් කිරීමට තීරණය කර ඇති පවුල් 14860 ක් සඳහා සුදුසු වෙනත් ස්ථානයක් ලබා දීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා 2017 ජූනි 10 දිනැතිව "නායයෑම් අධි අවදානම් කළාපවල ජීවත්වන පවුල් සඳහා ස්ථිර නිවාස ඉදිකිරීම" යන විෂය හා 2017 ඔක්තෝබර් 23 දිනැතිව "2017 වර්ෂයේ ඇතිවූ ගංවතුර ආපදා හේතුවෙන් තම නිවාස පූර්ණ හානියට පත්වීමෙන් වෙනත් ආරක්ෂිත ස්ථානයක නැවත පදිංචි කළයුතු පවුල් සඳහා ස්ථිර නිවාස ලබාදීම."යන විෂය යටතේ ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා 2017 ජූලි 05 දිනැති අංක අමප/17/1216/715/017 හා 2017 නොවැම්බර් 01 දිනැති අංක අමප/17/2340/715/017-1 දරන අමාත්‍ය මණ්ඩල තීරණ මඟින් අනුමැතිය ලැබ් තිබුණි.

එම අමාත්‍ය මණ්ඩල තීරණවල නියෝග ක්‍රියාත්මක කරමින් ආපදා කළමනාකරණ අමාත්‍යාංශය මඟින් දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත සිය අධීක්ෂණය යටතේ ප්‍රාදේශිය ලේකම් කාර්යාල මට්ටමෙන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා "නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ මාර්ගෝපදේශය" යොමුකර තිබුණි. 2017 ජූලි 31 දිනැති අංක NDRSC/1/2/3/RS දරන ආපදා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය මඟින් මහනුවර දිස්ත්‍රික් ලේකම් වෙත එම මාර්ගෝපදේශය යොමුකර තිබුණි.

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් ඉවත්කල යුතු ලෙස තවදුරටත් හඳුනාගෙන ඇති නායයෑම් අධිඅවදානම් කළාපවල පිහිටා ඇති පවුල් මෙම ව්‍යාපෘතිය යටතේ සුරක්ෂිත ස්ථානයක නැවත පදිංචි කිරීම සඳහා රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ පශු සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් 2019 අගෝස්තු 09 දිනැතිව " නායයෑමෙන් නිවාස හානිවී ඇති හා නායයෑම් අධි අවදානම් හේතුවෙන් තම පදිංචි ස්ථානයන්ගෙන් ඉවත් කල යුතු ලෙස තවදුරටත් හඳුනාගන්නා ලද පවුල් සඳහා ස්ථිර නිවාස ඉදිකිරීම "යන විෂය යටතේ ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2019 සැප්තැම්බර් 04 දිනැති අංක අමප/19/2259/120/037 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලැබී තිබුණි.

මාර්ගෝපදේශයේ දක්වා ඇති පරිදි මෙම වැඩසටහනේ මූලික අරමුණු පහත පරිදි වේ.

- ❖ ස්වභාවික ආපදා වලින් පූර්ණ හානියට පත්වන සහ ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් අධි අවදානම් නිසා ඉවත් කල යුතුලෙස හඳුනාගත් පවුල් සඳහා " නිවසට නිවසක් " සංකල්පය මත මූලික නිවස තැනීමේ මාර්ගෝපදේශය සහ මූල්‍ය සහය ලබාදීම.

- ❖ "වඩා යහපත් ලෙස ගොඩනගමු" (Built Back Better) යන සංකල්පය යොදා ගනිමින් නිවාස ඉදිකිරීමට යොමු කිරීම.

- ❖ ආපදා ප්‍රත්‍යාස්ථිතික (Resilient) නිවසක් ලෙස ඉදිකෙරේද යන්න ප්‍රත්‍යක්ෂ කර ගැනීම.

## 2.2 විගණනය සඳහා අධිකාර බලය

--------------------------------

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ කාර්යසාධන විගණනය කරන ලදී.

## 2.3 විගණනයේ අරමුණු

--------------------

මෙම විගණනයේ අරමුණ වනුයේනැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවදානම් කළාප හඳුනා ගැනීමේ වැඩ පිළිවෙල, සැලසුම්කරණය හා වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ අවධියේ කාර්යසාධනය ඇගයීමයි.

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කය පදනම් කරගනිමින් ව්‍යාපෘතියේ ක්‍රියාත්මක අවධියේ කාර්යසාධනය ඇගයීම හා ඒ සඳහා ව්‍යාපෘතියේ මූලික අරමුණු ඉටුවන අයුරින් කටයුතු කර තිබේද යන්න, ආපදා සහන සේවා මධ්‍යස්ථානය හා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය සම්බන්ධිතව ඉදිරිපත් කර තිබූ නැවත පදිංචි කිරීමේ මාර්ගෝපදේශයේ උපදෙස් හා ඊට සමගාමීව චක්‍රලේඛ හා ලිපි මඟින් නිකුත් කර ඇති උපදෙස් අනුව කටයුතු කර තිබේද යන්න හා එකී උපදෙස් අනුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා සම්බන්ධිත ආයතනවල දායකත්වය අපේක්ෂිත පරිදි ලැබී තිබේද යන්න සොයා බැලීම මෙහිදී අරමුණු කෙරේ.

## 2.4 විගණන විෂයපථය

--------------------

2.4.1 විගණන කාර්යය සඳහා ලබාගත හැකි කාලය හා මානව සම්පත් පදනම් කරගෙන කාර්යසාධන විගණනය නියැදි පදනමින් සිදුකරන ලදී. ව්‍යාපෘතියේ ක්‍රියාත්මක අවධියේ කාර්යසාධනය ඇගයීම මහනුවර දිස්ත්‍රික්කය පදනම් කරගනිමින් සිදුකළ අතර, දිස්ත්‍රික්කයේ ප්‍රාදේශිය ලේකම් කාර්යාල 20 හි ව්‍යාපෘතිය ක්‍රියාත්මක වී ඇති ආකාරය පිළිබඳව පරීක්ෂාවන් සිදුකරන ලදී. තෝරාගත් ප්‍රාදේශිය ලේකම් කාර්යාල 06 ක අධිඅවදානම් කළාපවල තවදුරටත් ජීවත්වන පවුල් පිළිබඳව, තෝරාගෙන ඇති රජයේ ඉඩම පිළිබඳව හා මූල්‍ය ප්‍රතිලාභ ලබාදී ඇති ප්‍රතිලාභීන් පිළිබඳව නියැදි භෞතික පරීක්ෂාවන් සිදුකරන ලදී.

2.4.2 ආපදා අධි අවදානම් කළාප හඳුනා ගැනීම හා ස්ථානීය පරීක්ෂාවක් සිදුකර නායයාම් අවදානම් තත්ත්ව පිළිබඳ නිර්දේශ ලබාදීම ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ උවදුරු සිතියම් කරනය හා මූලික භූ සමීක්ෂණ වාර්තා මඟින් සිදුකරනු ලැබේ. භූ විද්‍යා තාක්ෂණික දැනුම හා විද්‍යානුකූල පදනම් යොදා ගනිමින් සිදු කෙරෙන එකී නිර්දේශ ලබාදීම නිවැරදි බවට විගණනයේදී සලකනු ලැබූ බැවින් එම වාර්තාවල නිවැරදිතාවය පිළිබඳ පරීක්ෂාවන්ට යොමු නොවීය.

## 2.5 විගණන නිර්ණායක

--------------------

2.5.1 2017/06/10 දිනැති අංක 13/2017 දරන "නායයෑම් අධි අවදානම් කළාපවල ජීවත්වන පවුල් සඳහා ස්ථිර නිවාස ඉදිකිරීම" යන විෂය යටතේ ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා අනුමැතිය ලැබී තිබූ 2017 ජූලි 05 දිනැති අංක අමප/17/1216/715/017 දරන අමාත්‍ය මණ්ඩල තීරණය.

2.5.2 2017 ඔක්තෝබර් 23 දිනැතිව "2017 වර්ෂයේ ඇතිවූ ගංවතුර ආපදා හේතුවෙන් තම නිවාස පූර්ණ හානියට පත්වීමෙන් වෙනත් ආරක්ෂිත ස්ථානයක නැවත පදිංචි කළයුතු පවුල් සඳහා ස්ථිර නිවාස ලබාදීම." යන විෂය යටතේ ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා අනුමැතිය ලැබී තිබූ 2017 නොවැම්බර් 01 දිනැති අංක අමප/17/2340/715/017-1 දරන අමාත්‍ය මණ්ඩල තීරණය.

2.5.3 2019 අගෝස්තු 09 දිනැති රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ පශු සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් " නායයෑමෙන් නිවාස හානිවී ඇති හා නායයෑම් අධි අවදානම් හේතුවෙන් තම පදිංචි ස්ථානයන්ගෙන් ඉවත් කල යුතු ලෙස තවදුරටත් හඳුනාගන්නා ලද පවුල් සඳහා ස්ථිර නිවාස ඉදිකිරීම "යන විෂය යටතේ ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා අනුමැතිය ලැබී තිබූ 2019 සැප්තැම්බර් 04 දිනැති අංක අමප/19/2259/120/037 දරන අමාත්‍ය මණ්ඩල තීරණය.

2.5.4 2017 ජූලි 31 දිනැති අංක NDRSC/1/2/3/RS දරන ආපදා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය මඟින් මහනුවර දිස්ත්‍රික් ලේකම් වෙත යොමුකර ඇති "නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ මාර්ගෝපදේශය"

2.5.5 ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය හා ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය සම්බන්ධිතව 2017 ඔක්තෝබර් වන විට ඉදිරිපත් කර ඇති "නායයෑමෙන් විපතට පත්වූ ජනතාව සඳහා හිමිකරු විසින්ම තම නිවස ඉදිකිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ මාර්ගෝපදේශය"

2.5.6 ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් 2018 වර්ෂයේදී ප්‍රකාශයට පත්කර ඇති ආපදා ප්‍රත්‍යාස්ථිතික ඉදිකිරීම් පිළිබඳ තාක්ෂණික මාර්ගෝපදේශය

## 2.6 සම්බන්ධිත ආයතන

--------------------

| ආයතනය<br>---------- | කාර්යය භාරය කෙටියෙන්<br>------------------------------ |
|---|---|
| (අ) ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය (NBRO) | • නායයෑම් පර්යේෂණ හා ආපදා කළමනාකරණ අංශය (LRRMD)මගින් ශ්‍රී ලංකාව තුළ ඇති නායයෑම් අවදානම් කළාප සිතියම්ගත කිරීමේ ව්‍යාපෘතිය යටතේ අවදානම් කළාප හඳුනා ගැනීම.<br><br>• දිවයිනේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ මට්ටමින්, දිස්ත්‍රික් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානවලින් හා ප්‍රදේශිය ආපදා සහන සේවා නිලධාරීන්ගෙන් ග්‍රාම සේවක නිලධාරීන්ගෙන් හා ජනතාවගෙන් ලැබෙන ඉල්ලීම් අනුව ස්ථානීය පරීක්ෂාවන් සිදුකර අවදානම් තත්ත්වය පිළිබඳ ලිඛිත නිර්දේශ ලබාදීම.<br><br>• මානව ජනාවාස සැලසුම් හා පුහුණු අංශය (HSPTD) මගින් නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතියේ ආපදා ප්‍රත්‍යාස්ථිතික නිවාස ඉදිවන බවට තහවුරු කර ගැනීම සඳහා අවශ්‍ය නිර්දේශ සහ තාක්ෂණික සහය ලබාදීම.<br><br>• අවදානම් කළාපවල ජීවත්වන පුද්ගලයින් සම්බන්ධ දත්ත පද්ධතියක් පවත්වා ගෙන යාම.<br><br>• හදිසි ආපදා තත්ත්වයන් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීම් කටයුතු |

| | | |
|---|---|---|
| (ආ) | ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය | • ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සැලසීම.<br>• ව්‍යාපෘතියේ ප්‍රගතිය සමාලෝචනය සඳහා දිස්ත්‍රික් මට්ටමින් පත්කර ඇති මාණ්ඩලික නිලධාරින්, දිස්ත්‍රික් හා ප්‍රදේශිය ආපදා සහන සේවා නිලධාරින් හා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ නිලධාරින් සම්බන්ධීකරණය |
| (ඇ) | මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | • මහනුවර දිස්ත්‍රික්කයේ නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා මූලිකත්වය ගෙන කටයුතු කිරීම.<br>• ක්‍රියාකාරී කමිටුව සහ ඉඩම් තෝරා ගැනීමේ කමිටුව වැනි කමිටු හරහා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අදාළවන රාජ්‍ය ආයතනවල සම්බන්ධීකරණය ඇති කිරීම.<br>• දිස්ත්‍රික්කය සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ඉල්ලුම් කිරීම හා ප්‍රාදේශිය ලේකම් කාර්යාල වෙත ලබාදීම. |
| (ඇ) | මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රදේශිය ලේකම් කාර්යාල | • බල ප්‍රදේශය තුළ අධි අවදානම් කළාපවල ජීවත්වන බවට හඳුනාගෙන ඇති පුද්ගලයින් ලියාපදිංචි කර ගැනීම.<br>• විකල්ප අවස්ථා යටතේ ප්‍රතිලාභ ලබාදීම.<br>• ලබාගත් ප්‍රතිලාභ උපයෝජනය සම්බන්ධයෙන් පසු විපරම් කිරීම |

## 03. විගණන නිරීක්ෂණ

--------------------

## 3.1 අවදානම් කළාප හඳුනා ගැනීම හා ක්‍රියාත්මක වීමේ මූලික වැඩපිළිවෙල

--------------------------------------------------------------------------

ශ්‍රී ලංකාව තුළ ඇති නායයෑම් අවදානම් කළාප/ ස්ථාන හඳුනා ගැනීමේ කටයුතු ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය මඟින් සිදුකරන අතර, අමාත්‍ය මණ්ඩල තීරණ අනුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා මඟපෙන්වීමේ කටයුතු ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය හා ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය සම්බන්ධිතව සිදුකරනු ලැබේ. එම කටයුතු සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් සිදුකරනු ලැබේ.

### 3.1.1 අවදානම් කළාප හඳුනා ගැනීම අඛණ්ඩව සිදුවීම

-------------------------------------------------

(අ) ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ 2018 -2020 සංයුක්ත සැලැස්ම අනුව නායයෑම් පර්යේෂණ හා ආපදා කළමනාකරණ අංශය (LRRMD) මඟින් උවදුරු සිතියම් කරන කටයුතු 2018 වර්ෂය අවසාන වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණු නමුත් විගණන අවස්ථාව වූ 2019 ඔක්තෝබර් 30 වන විට 1:50000 පරිමාණයේ සිතියම්කරන කටයුතු අවසන් කිරීමට හැකිවී තිබූ අතර,විශාල මානව සම්පත් ප්‍රමාණයක් අවශ්‍යවීම හා සැලකිය යුතු කාලයක් වැයවීම හේතුවෙන් 1:10000 පරිමාණයේ සිතියම්කරන කටයුතු රටේ සියළුම ප්‍රදේශ ආවරණය වන පරිදි සිදුකිරීමට නොහැකි වී තිබුණි.

(ආ) නායයාම් අධි අවදානම් ප්‍රදේශවල ජීවත්වන පුද්ගලයින් පදිංචි ස්ථාන මට්ටමින් පැහැදිලිව හඳුනා ගැනීම සඳහා 1:10000 පරිමාණයේ සිතියම්කරනය වැදගත්වන බව නිරීක්ෂණය වූ අතර, එකී සිතියම්කරන කටයුතු අවසන් කර ඇති ප්‍රදේශවල අධි අවදානම් ප්‍රදේශවල පවතින ගොඩනැගිලි / නිවාස ඇති ස්ථාන පැහැදිලිව හඳුනාගත හැකි ලෙස සිතියම්ගත කර තිබුණි.

(ඇ) මහනුවර දිස්ත්‍රික්කයේ 1:10000 පරිමාණයේ සිතියම්කරනය සම්බන්ධ ප්‍රගතිය සලකා බැලීමේදී ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 14 ක පමණක් සිතියම්කරන කටයුතු නිමකර ඇති බවත් පහත සඳහන් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 06 හි සිතියම්කරනය අවසන් කර නොමැති බවත් නිරීක්ෂණය විය.

ප්‍රාදේශිය ලේකම් කාර්යාලය

--------------------------------

i. තුම්පනේ
ii. දෙල්තොට
iii. මිණිපේ
iv. අකුරණ
v. උඩුදුම්බර
vi. හතරලියද්ද

(ඈ) උවදුරු සිතියම්කරණයට අමතරව ස්ථානීය පරීක්ෂාවන් සිදුකර එම ස්ථානයේ නායයෑම් අවදානම් මට්ටම අධි , මධ්‍ය හා අවම ලෙස දක්වමින් තනි පුද්ගලයින් වෙත හෝ පුද්ගල කණ්ඩායම් වෙත මූලික භූ සමීක්ෂණ වාර්තා මඟින් දැනුම්දීම සිදුකර තිබුණද අධි අවදානම් කළාපවල ජීවත්වන පුද්ගලයින් එකී නිර්දේශ පිළිබඳව අවදානයෙන් සලකා බලා නොතිබුණු අවස්ථා පැවතුණි.

### 3.1.2 දත්ත හා තොරතුරු පද්ධතිය

-----------------------------

නිමකර ඇති 1:10000 පරිමාණයේ සිතියම් පදනම් කර ගනිමින් හඳුනාගත් අධි අවදානම් කළාපවල ඇති ගොඩනැගිලි පිළිබඳව සමීක්ෂණය කර දත්ත පද්ධතියක් (Building survey) සකස් කිරීම හා ස්ථානීය පරීක්ෂාවන් කර ලබාදුන් මූලික භූ සමීක්ෂණ වාර්තා පදනම් කර ගනිමින් (SPI Location) දත්ත පද්ධතියක් නඩත්තු කිරීම යන ව්‍යාපෘති 02 ක් යටතේ අධි අවදානම් කළාපවල ඇති ගොඩනැගිලි හා ප්‍රතිලාභින් සම්බන්ධ දත්ත ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ මානව ජනාවාස සැලසුම් හා පුහුණු අංශය (HSPTD) මඟින් නඩත්තතු කරමින් පවතින බවත් SPI Location ව්‍යාපෘතිය යටතේ අධි අවදානම් කළාපවල ජීවත්වන පවුල් ඒකක මට්ටමින් ස්ථානීය ඡායාරූපද ඇතුළත් වන පරිදි එකී දත්ත පද්ධතිය නඩත්තු කරමින් පැවතුණි.

(අ) මහනුවර දිස්ත්‍රික්කයේ ඉහත දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම පිළිබඳව සලකා බැලීමේදී 1:10000 පරිමාණයේ සිතියම් පදනම් කර ගනිමින් ප්‍රාදේශිය ලේකම් බලප්‍රදේශ 13 ක ගොඩනැගිලි 13013 ක් සමීක්ෂණය කර දත්ත ඇතුළත් කිරීමට සැලසුම් කර තිබෙන නමුත් 2019 නොවැම්බර් 29 දින වන විට ගොඩනැගිලි සමීක්ෂණ 9519 ක් සහ ඉන් දත්ත ඇතුළත් කිරීම් 2615 ක් පමණක් අවසන් කර පිළිවෙලින් ගොඩනැගිලි සමීක්ෂණ 3494 ක් සහ දත්ත ඇතුළත් කිරීම් 10398 ක් නිමකිරීමට පැවතුණි.

(ආ) මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 කට අයත් ග්‍රාම නිලධාරී වසම් 359 ක ග්‍රාම නිලධාරීන් වෙත ලබාදුන් සමීක්ෂණ වාර්තා පදනම් කරගනිමින් මෙම දත්ත පද්ධතිය යාවත්කාලීන කරන අතර, එකී සමීක්ෂණ වාර්තා සම්පූර්ණ කර ලබාදීමේ ප්‍රගතිය අවම මට්ටමක පවතින බවත්, එම නිසා දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීමේ කටයුතු ප්‍රමාද වෙමින් පවතින බවත් නිරීක්ෂණය විය.2019 නොවැම්බර් 30දින වන විට ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 කට අයත් ග්‍රාම නිලධාරී වසම් 55ක එකී සමීක්ෂණ වාර්තා නිමකර ලබාදීමේ ප්‍රගතිය සියයට 0සිට 66 දක්වා අවම මට්ටමක පැවතුණි. විස්තර ඇමුණුම 01 හි දැක්වේ.

(ඇ) SPI Location දත්ත පද්ධතිය නඩත්තු කිරීම සම්බන්ධයෙන් මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රගතිය සලකා බැලීමේදී 2019 වර්ෂය අවසාන වන විට SPI Location 2460 ක් අතරින් SPI Location 285 ක දත්ත පද්ධතියට ඇතුළත් කිරීමට තිබුණි.

(ඈ) ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ මානව ජනාවාස සැලසුම් හා පුහුණු අංශය (HSPTD) මගින් සකස් කර ඇති දත්ත මේ වන තෙක් මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හෝ මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා ලබාදී නොතිබුණි..

### 3.1.3 සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම

(අ) ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ 2018-2020 සංයුක්ත සැලැස්මෙහි ඇතුළත් 2018, 2019 සහ 2020 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම අනුව අවදානම් ප්‍රත්‍යාපීතික ඉදිකිරීම් සිදුකිරීම, ඒ සඳහා වූ මාර්ගෝපදේශ සංවර්ධනය කිරීම, පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම, පරියේෂණ හා සංවර්ධන කටයුතු ජාතික මට්ටමින් සිදුකිරීම, පූර්ව අනතුරු ඇඟවීම් පද්ධති සකස් කිරීම, නායයාම් අනතුරු වැලැක්වීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ උවදුරු සිතියම්කරනය සම්බන්ධයෙන් සැලසුම් කර තිබූ නමුත් නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතියේ ක්‍රියාත්මක මට්ටම සම්බන්ධයෙන් ක්‍රමෝපායන් හෝ වැඩසටහන් සැලසුම් කර නොමැති බව නිරීක්ෂණය විය.

(ආ) ව්‍යාපෘතියේ ක්‍රියාත්මක මට්ටමේ කටයුතු මෙහෙයවනු ලබන ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය මගින් සිය විෂය යටතට අදාළ කටයුතු සඳහා සංයුක්ත හෝ ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි.

(ඇ) ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් සකස් කරතිබූ ව්‍යාපෘති වාර්තාවේ ඇති මූල්‍ය සැලැස්ම ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානයේ ක්‍රියාකාරී සැලැස්ම ලෙස යොදා ගනිමින් පැවති බව නිරීක්ෂණය විය.

### 3.1.4 මූල්‍ය සැලැස්ම

----------------

(අ) ඉහතව්‍යාපෘති වාර්තාවේ, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා සම්පූර්ණ වියදම රු.21,050,000,000 (රු.මිලියන 21,050 ක්) (කළමනාකරණ හා මූල්‍ය වියදම් හැර) වූ පස් අවුරුදු මූල්‍ය සැලැස්මක් සකස් කර තිබුණි. 2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් 2019 සැප්තැම්බර් වන විට රු.මිලයන 2,699 ක් වැයකර තිබූ අතර එය සමස්ථ අයවැයගත වියදමින් සියයට 13 ක් වැනි අවම අගයක් ගෙන තිබුණි.

(ආ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා වූ මූල්‍ය ප්‍රතිපාදන අනුමත කිරීම හා අවශ්‍ය අක් මුදල් නිදහස් කිරීමේ කටයුතු සිදු කරනු ලබන ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය මඟින් ද ඉහත මූල්‍ය සැලැස්ම පාදක කර ගනිමින් කටයුතු කරන නමුත් දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශිය ලේකම් කාර්යාල වැනි ව්‍යාපෘතියේ ක්‍රියාත්මක මට්ටමේ ආයතන අනුව ප්‍රතිපාදන වෙන්කළ යුතු ආකාරය සඳහා වූ මූල්‍ය සැලැස්මක් සකස් කර නොතිබූ අතර,ඉදිකෙරෙමින් පවතින/ ඉදිකිරීමට සැලසුම්කර ඇති නිවාස සංඛ්‍යාව පදනම් කර ගනිමින් දිස්ත්‍රික් මට්ටමෙන් යොමුවන ඉල්ලීම් සඳහා ප්‍රතිපාදන ලබාදීමේ ක්‍රමවේදයක් අනුගමනය කරමින් පැවතුණි.

### 3.1.5 මානව හා භෞතික සම්පත්

----------------------------

(අ) ඉහත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා පහත වෘත්තිකයින්ගෙන් සැදුම්ලත් කාර්යය මණ්ඩලයක් අවශ්‍ය බව ව්‍යාපෘති වාර්තාවේ දක්වා තිබෙන නමුත්, විගණන අවස්ථාව වන විටත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් වූ එවැනි කාර්යය මණ්ඩලයක් ස්ථාපිත කර නොතිබුණි.

| තනතුර | අවශ්‍ය කාර්යය මණ්ඩලය |
|---|---|
| ---------- | ---------------- |
| ව්‍යාපෘති කළමනාකරු | 01 |
| නගර සැලසුම්කරුවන් | 10 |
| ගෘහ නිර්මාණ ශිල්පීන් | 02 |
| ඉංජිනේරුවන් | 05 |
| සැලසුම් ශිල්පී (Draughtstsman) | 05 |
| ප්‍රමාණ සමීක්ෂක (Quantity Surveyor) | 03 |
| තාක්ෂණික නිලධාරින් | 05 |
| සහයක කාර්යය මණ්ඩලය / කළමනාකරණ සහකාර | 05 |

(ආ) ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ නායයෑම් පර්යේෂණ හා ආපදා කළමනාකරණ අංශය (LRRMD) මඟින් ක්‍රියාත්මකවන නායයෑම් හඳුනා ගැනීමේ හා සිතියම් ගත කිරීමේ ව්‍යාපෘතිය සඳහා විද්‍යාඥයින් 07 දෙනෙකුගෙන් සමන්විත කාර්යය මණ්ඩලයක් යොදවා ඇති අතර ඉන් දෙදෙනෙකු තාවකාලික පදනමින් බඳවාගෙන ඇත. සිතියම්කරන කටයුතු කඩිනම් කිරීම සඳහා අතිරේක විද්‍යාඥයින් 07 දෙනෙකුගේ අවශ්‍යතාවයක් පැවති බව ද නිරීක්ෂණය විය.

(ඇ) ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය සඳහාද මෙම ව්‍යාපෘතියේ කටයුතු මෙහෙයවීම සඳහා වෙන්වූ කාර්යය මණ්ඩලයක් ලබාදී නොතිබුණි.

(ඈ) වර්ෂ කිහිපයක සිටම දිවයින තුළ අඛණ්ඩව සිදුවන ස්වභාවික ආපදා තත්ත්වයන් හේතුවෙන් ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය සතු කාර්යය භාරය පුළුල් වීම හා ස්වභාවික ආපදා සඳහා වූ රක්ෂණාවරන වැඩසටහන, වියලි සලාක බෙදා දීම,සුරක්ෂිත මධ්‍යස්ථාන ඉදිකිරීම, ස්වභාවික ආපදා සඳහා සහන සැලසීම වැනි කඩිනමින් ඉටුකළ යුතු කාර්යය භාර රැසක් පවතින බැවින් නැවත පදිංචි කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් මානව සම්පත් නොමැති බව නිරීක්ෂණය විය.

(ඉ) නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය ඇතුළුව ඉහත සඳහන් සියළු කාර්යයන් ඉටු කිරීම සඳහා ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය සඳහා දිවයිනේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශිය ලේකම් කාර්යාල සඳහා අනුමතව ඇති ආපදා සහන සේවා නිලධාරින් සංඛ්‍යාව 368 ක් පමණක් වූ අතර, විගණිත අවස්ථාව වන විට පුරප්පාඩු 19 ක් පැවතුණි.

(ඊ) ඉහත තත්ත්වය පිළිබඳව දැනුවත් කරමින් රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම් (පාලන) විසින් 2019 අගෝස්තු 13 දිනැති අංක NDRSC/02/03/06/2019 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ඇමතූ ලිපියක් මඟින් ආයතනයේ පුළුල් වී ඇති කාර්යය භාරය ඉටු කිරීම සඳහා දිස්ත්‍රික් හා ප්‍රාදේශිය ලේකම් කාර්යාල වෙත එක් ආපදා සහන සේවා නිලධාරියෙකු පමණක් අනුයුක්ත කිරීම ප්‍රමාණවත් නොවන බවත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 ට හා ප්‍රාදේශිය ලේකම් කාර්යාල 332 ට නව සංවර්ධන නිලධාරි තනතුරු 357 ක් ඇති කර දෙන ලෙසත්, ඉල්ලීම් කර ඇති නමුත් 2019 දෙසැම්බර් 06 දින වන විටත් ඒ සඳහා අනුමැතිය ලැබී නොතිබුණි.

(උ) මහනුවර දිස්ත්‍රික්කයේ ඇතැම් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශවල ආපදා සහන සේවා නිලධාරි තනතුර පුරප්පාඩුව පැවතීම, අධි අවදානමට ලක්වූවන් ඉහළ සංඛ්‍යාවක් සහිත ප්‍රාදේශිය ලේකම් කාර්යාල සඳහා එක් සහන සේවා නිලධාරියෙකු ප්‍රමාණවත් නොවීම සහ අනුයුක්ත කළ නිලධාරින් කෙටි කාලයක් තුළ ස්ථාන මාරු වීම වැනි කරුණු එම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශවල ව්‍යාපෘතියේ ප්‍රගතිය අවම වීමට හේතුවක්වී තිබූ බව නිරීක්ෂණය විය.

### 3.2 වැඩසටහනේ ක්‍රියාත්මක අවධිය

නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ මාර්ගෝපදේශ උපදෙස් අනුව ව්‍යාපෘතියේ ක්‍රියාත්මක අවධිය සම්බන්ධයෙන් මහනුවර දිස්ත්‍රික්කයේ තත්ත්වය සලකා බැලීමේදී පහත කරුණු නිරීක්ෂණය විය.

### 3.2.1 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කමිටු ස්ථාපිත කර නොතිබීම

(අ) නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ මාර්ගෝපදේශයෙහි පියවර අංක 01 අනුව නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම දිස්ත්‍රික් ලේකම්වරයාගේ මූලිකත්වයෙන් යුතුව ස්ථාපිත කරගත් ක්‍රියාකාරී කමිටුවක් හරහා සිදුකල යුතු වුවද විගණන අවස්ථාව වූ 2019 ඔක්තෝබර් 30 දින වන විට ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර වසර 02 කුත් මාස 03 ට වැඩි කාලයක් ගතවී තිබුණු නමුත් එවැනි කමිටුවක් ස්ථාපිත කර නොතිබුණි.

(ආ) නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ මාර්ගෝපදේශයෙහි පියවර අංක 02 අනුව ඒ ඒ ප්‍රදේශවල ප්‍රාදේශිය ලේකම්වරු විසින් හඳුනා ගැනීමේ කමිටුවක් ස්ථාපිත කොට ප්‍රතිලාභින් තෝරා ගැනීම එම කමිටුවේ සහය ඇතුව සිදුකිරීම කල යුතු වුවත් එසේ කටයුතු කර නොතිබීම නිසා මෙම ව්‍යාපෘතිය යටතේ ප්‍රතිලාභ සැලසිය යුතු පුද්ගලයින් ඒ සඳහා තෝරාගෙන නොතිබු අවස්ථා පැවති බව නිරික්ෂණය විය. නිදසුන් වශයෙන් පහත කරුණු නිරික්ෂණය විය.

i. ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් නායයෑම් අධි අවදානම් ප්‍රදේශවල ජීවත්වන බවට හඳුනාගෙන තිබු උඩුදුම්බර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ පවුල් 16 ක් සඳහා රජයේ බලපත්‍රයක් මඟින් නව ඉඩම් හා නිවාස සංවර්ධන අධිකාරය විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතියක් මඟින් නව නිවාස ඉදිකර ගැනීමට එක් ප්‍රතිලාභියෙකු සඳහා රු.500,000 ක් බැගින් ණය මුදලක් ලබාදී තිබුණි. කෙසේ වෙනත් මේ යටතේ නිවාස ඉදිකිරීම් සම්පූර්ණ කිරීම සඳහා එම පුද්ගලයින් හට නොහැකි වී තිබු අතර, එම ණය මුදල සම්පූර්ණයෙන් ඔවුන් හට ලැබී නොතිබුණි. ඒ අනුව, ඔවුන් වර්තමානය වන විටත් අධි අවදානම් සහිත නිවාසවලම පදිංචි වී සිටින අතර, මේ යටතේ ප්‍රතිලාභ ලබාගත් එක් පුද්ගලයෙකු අඩක් නිමකළ නව නිවස ආසන්නයේ තාවකාලිකව ඉදිකරන ලද මඩුවක ජීවත්වන බව 2019 ඔක්තෝබර් 25 දින සිදුකළ භෞතික විගණන පරීක්ෂාවේදී නිරික්ෂණය විය. එමෙන්ම

නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය වෙත එම පුද්ගලයින් ඇතුළත් කරගෙනද නොතිබුණි. ඡායාරූප පහත දැක්වේ



නිවාසසංවර්ධන අධිකාරිය ලබාදුන් රු.500,000 ක ණය මුදල යොදා ඉදිකර වැඩ නිම නොකළ නිවාස



අඩක් නිමකළ නව නිවස ආසන්නයේ තාවකාලිකව ඉදිකරන ලද මඩුවක ජීවත්වීම

ii. ගඟ ඉහළ ප්‍රදේශිය ලේකම් කොට්ඨාශයේ උඩුවැල්ල ග්‍රාම නිලධාරි වසමේ පදිංචිව සිටි ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් අධි අවදානම් ලෙස හඳුනාගත් පුද්ගලයෙකු වෙත පළමු වාරිකය ලෙස රු.200,000 ක් 2018 පෙබරවාරි 28 දින ගෙවා තිබූ නමුත්, එම නිවස වෙනත් පුද්ගලයෙකුට අයත් වන බව සනාථ වීම නිසා ලබාදුන් රු.200,000 මුදල නැවත ප්‍රාදේශිය ලේකම් කාර්යාලය වෙත ගෙවා තිබුණි. හිමිකම සනාථ කර ගැනීමකින් තොරව නොසැලකිලිමත් ලෙස ගෙවීම් සිදු කිරීම නිසා මෙවැනි ගැටලුකාරී තත්ත්වයක් ඇතිවී තිබුණු බව නිරීක්ෂණය විය.

iii. ගහ ඉහළ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ පදිංචි වී සිටි පුද්ගලයින් 15 දෙනෙක් වෙත නොසැලකිලිමත් ලෙසකරුණු සලකා බැලීමකින් තොරව රු.200,000 ක් බැගින් වූ රු.3,000,000 ක චෙක්පත් නිකුත් කර තිබුණ ද,එම චෙක්පත් එම පුද්ගලයින් විසින් ලබාගෙන නොතිබුණි. එකී පුද්ගලයින් අතරින් තිදෙනෙකු ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් නායයෑම් මධ්‍ය අවදානම් ලෙස හඳුනාගෙන තිබුණු පුද්ගලයන් වන අතර, පුද්ගලයින් 08 දෙනෙක් අධි අවදානම් ප්‍රදේශවල ජීවත්වන බවට හඳුනාගෙන තිබුණද ඔවුන් කොට්ඨාශයෙන් පිටතට පදිංචිය සඳහා යාමට අපේක්ෂා කරන පුද්ගලයන් විය. තවත් පුද්ගලයෙකු රජය විසින් ලබාදෙන ඉඩම භාර නොගන්නා බව ප්‍රකාශ කළ අයෙකු වූ අතර, රජයේ ඉඩමෙන් ඉඩම් කැබැල්ලක් වෙන්කර නොදුන් එක් පුද්ගලයෙක්ද විය.

iv. තවද අධිඅවදානම් ලෙස හඳුනාගත් බවට ලිඛිත සාක්ෂි ලිපිගොනුතුළ නොතිබුණද ව්‍යාපෘතිය යටතේ ප්‍රතිලාභ ලබාදී තිබුණු අවස්ථාද නිරීක්ෂණය විය. මෙහිදි ගගඉහළ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය විසින් එවැනි ලිඛිත සාක්ෂි නොමැති පුද්ගලයන් 13 ක් වෙත රු.200,000 බැගින් රු.2,600,000 ක් නැවත පදිංචි කිරීම සඳහා පළමු වාරිකය ලෙස ගෙවා තිබුණි. විස්තර ඇමුණුම අංක 02 හි දැක්වේ.

(ඇ) මාර්ගෝපදේශයෙහි පියවර අංක 03 අනුව නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලියේදි අවතැන් වූ පුද්ගලයන් විසින් නැවත පදිංචි කිරීමේ වැඩසටහනට අදාළව සිදු කරනු ලබන පැමිණිලි හා අභියාචනා විභාගය සඳහා පැමිණිලි හා අභියාචනා විභාග කිරීමේ කමිටුවක් දිස්ත්‍රික් ලේකම්වරයා විසින් ස්ථාපිත කල යුතු වුවත් විගණන අවස්ථාව වන 2019 ඔක්තෝබර් 30 දිනට ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර වසර 02 කුත් මාස 03 කට වැඩි කාලයක් ගතවී තිබුණු නමුත් එවැනි කමිටුවක් ස්ථාපිත කර නොතිබුණි.

(ඈ) මාර්ගෝපදේශයෙහි පියවර අංක 05 අනුව ප්‍රාදේශිය ලේකම්වරුන් විසින් නැවත පදිංචි කිරීම සඳහා ඉඩම් හඳුනා ගැනීමේදී පොදු අවශ්‍යතා පහසුවෙන් සපයාගත හැකි ඉඩම් තෝරා ගත යුතුය. එබැවින් නැවත පදිංචි කිරීම සඳහා ඉඩම් තෝරා ගැනිමේදී නිශ්චිතව දක්වා ඇති වෘත්තිකයන්ගෙන් සැදුම්ලත් ඉඩම් තෝරා ගැනීමේ කමිටුවක් ස්ථාපිත කල යුතු අතර ප්‍රාදේශිය ලේකම්වරු විසින් හඳුනාගත් සියලු ඉඩම් කමිටුව මගින් අධීක්ෂණය කොට නිර්දේශ කල

යුතුය. එසේ කමිටුවක් ස්ථාපිත නොකර මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශිය ලේකම්වරු විසින් හඳුනාගන්නා ලද ඉඩම් සඳහා දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටුවෙහි නිර්දේශය ලබාගෙන තිබූ බව නිරීක්ෂණය විය.

### 3.2.2 ප්‍රතිලාභීන් ලියාපදිංචිය

(අ) නායයෑම් මඟින් හානි සිදුවූ නිවාස හිමිකරුවන් සහ ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් අධි අවදානම් ලෙස හඳුනාගත් පුද්ගලයන් මාර්ගෝපදේශයෙහි පියවර 04 අනුව ආකෘති පත්‍ර භාවිතා කර ලියාපදිංචි කර ගැනීම සිදු කල යුතු වුවත් එසේ සිදු කර නොතිබුණු අවස්ථා බහුල වශයෙන් නිරීක්ෂණය විය. මහනුවර දිස්ත්‍රික්කයේ සිටින අධි අවදානම් ප්‍රදේශවල ජීවත්වන පුද්ගලයින් 1431 දෙනෙකුගෙන් 392 ක් පමණක් නියමිත ආකෘතිය භාවිතා කර ලියාපදිංචි කරගෙන තිබුණි. විස්තර ඇමුණුම 03 හි දැක්වේ.

(ආ) මාර්ගෝපදේශයෙහි පියවර අංක 04 අනුවතෝරාගත් ප්‍රතිලාභින් නියමිත ආකෘතිපත්‍ර අනුව ලියාපදිංචි කිරිමෙන් අනතුරුව එම ප්‍රතිලාභින් ලැයිස්තුව අදාළ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය තුළ හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශ වෙබ් අඩවිය තුල දින 07 ක කාලයක් මහජනතාව සඳහා ප්‍රදර්ශනය කල යුතු වුවද එසේ කටයුතු කර නොතිබුණි.

### 3.2.3 ප්‍රතිලාභින්/ නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන්

මාර්ගෝපදේශයෙහි පියවර අංක 04 අනුව ව්‍යාපෘතිය පිළිබඳව ප්‍රතිලාභින් දැනුවත් කිරිම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත් වූ බවට ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් නොවූ අවස්ථා පැවතුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) යටිනුවර , ගඟවට කෝරළේ , උඩුදුම්බර සහ ගඟ ඉහළ යන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය තුළ මෙම ව්‍යාපෘතිය යටතේ නැවත පදිංචි කිරීම සඳහා හඳුනා ගන්නා ලද පුද්ගලයින් වෙත ප්‍රාදේශිය ලේකම් කාර්යාල මට්ටමින් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වූ බවට ලිඛිත සාක්ෂි ඉදිරිපත් නොවුණි.

(ආ) ගඟ ඉහළ ප්‍රදේශිය ලේකම් කොට්ඨාශයේ පට්තලාව ග්‍රාම නිලධාරි වසමේ බෙරවිල ග්‍රාමයේ පදිංචි ප්‍රතිලාභියෙකු වෙත රජයේ ඉඩම් කැබැල්ලක් සහ පළමු වාරිකය ලෙස රු.200,000 මුදලක් 2018 පෙබරවාරි 28 දින ලබාදී තිබූ අතර, මෙම ප්‍රතිලාභියා 2019 සැප්තැම්බර් 05 දින ලිපියක් මඟින් තමන් තෝරාගත් වෙනත් ඉඩමක නිවසක් ඉදිකර ඇති බව දක්වමින් ලබාදී තිබුණු

රු.200,000 ක මුදල නැවත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත යවා තිබුණි. ව්‍යාපෘතියේ විකල්ප අවස්ථා 02 යටතේ ඔහුට මෙම ප්‍රතිලාභය ලබාගත හැකිව තිබු නමුත්ජ් පිළිබඳව ප්‍රතිලාභියාගේ දැනුවත්භාවයක් නොමැති වීම හේතුවෙන් මෙම ව්‍යාපෘතිය යටතේ ප්‍රතිලාභ ලබා ගැනීමට නොහැකි වී තිබුණු බව නිරික්ෂණය විය.

(ඇ) තමා පදිංචි ස්ථානයට ඇති අවදානම් තත්වය පිළිබඳව ලිඛිතව තහවුරු කර ගැනීම හා විශ්වාසය ඇති කර ගැනීම සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් නිකුත් කරන ලද හු සමීක්ෂණ වාර්ථා පිටපත් අදාළ පුද්ගලයන් වෙත ලබා දී නොතිබූ නිසා එම පුද්ගලයින් තමන් වෙත ඇති අවධානම සම්බන්ධව අඩු සැලකිල්ලක් දැක්වීම හේතුවෙන් නැවත පදිංචි කිරීමේ වැඩසටහන ඉදිරියට ක්‍රියාත්මක කිරීමට බාධා සිදු වී තිබූ බව නිරීක්ෂණය විය.

### 3.2.4 ප්‍රතිලාභින් සඳහා විකල්ප අවස්ථා හඳුනා ගැනීම හා ප්‍රතිලාභ ලබාදීම

තෝරාගත් විකල්ප අවස්ථා යටතේ ප්‍රතිලාභ ලබාදීම සම්බන්ධයෙන් මහනුවර දිස්ත්‍රික්කය තුළ සිදුකරන ලද විගණන පරීක්ෂාවන්ගෙන් නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

#### 3.2.4.1 ඉඩමක් සමග නිවසක් මිලට ගැනීමට මූල්‍යාධාර ලබාදීම.

(අ) මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ 20 ක් තුල අධි අවදානම් ලෙස හඳුනාගන්නා ලද ප්‍රතිලාභින් 28 ක් මෙම විකල්ප අවස්ථාව යටතේ අවස්ථා තෝරාගෙන තිබුණ ද, විගණිත අවස්ථාව වූ 2019 ඔක්තෝබර් 30 දිනවන විට ප්‍රතිලාභින් 06 දෙනෙකු පමණක් වෙනත් ස්ථානයක ඉඩම් හා නිවාස මිලදීගෙන තිබුණි.

(ආ) මිනිපේ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුල මෙම විකල්පය යටතේ ඉඩම මිලදී ගැනීම සඳහා රු.400,000 ක් සහ නිවස සඳහා රු.1,200,000ක් වශයෙන් රු.1,600,000 ක් 2018 දෙසැම්බර් 31 දින අංක 249757 දරන චෙක්පත මගින් විකුණුම්කරු වෙත ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් වැඩිදුර පරීක්ෂාවේදී මෙම ඉඩම විකුණුම්කරු වෙත ඉඩම් සංවර්ධන අඥා පනතේ 19 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ අංක මධ්‍ය/මීපේ/1303 දරන ප්‍රදාන පත්‍රය මගින් රජය විසින් ප්‍රදානය කරන ලද නැවත විකිණීම කල නොහැකි

රජය විසින් පැවරීම පමණක් සිදුකල හැකි ඉඩමක් බවත්, උක්ත විකුණුම්කරු වෙත එවැනි ඉඩමක් වෙනුවෙන් රජය විසින් රු.1,600,000 ක මුදලක් ගෙවා තිබුණු බවත් නිරික්ෂණය විය.

(ඈ) මෙම විකල්ප අවස්ථාව යටතේ උඩුදුම්බර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුල විකුණුම්කරුවකු වෙත රු.400,000 ක් ඉඩමටද, නිවස සඳහා රු.1,130,000 ක්ද 2019 සැප්තැම්බර් 16 දින උඩුදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ගෙවා තිබුණි. කෙසේ වුවත් මෙම මිලදී ගන්නා ලද ඉඩම විකුණුම්කරු වෙත මධ්‍යම/විල්/ජ/3940 දරන ප්‍රධාන පත්‍රය මඟින් රජය විසින් ප්‍රධානය කරන ලද නැවත විකිණීම කළ නොහැකි ඉඩමක් බවද ප්‍රාදේශීය ලේකම් විසින් විකුණුම්කරු වෙත ඉහත ඉඩම වෙනුවෙන් රු.1,530,000 ක් ගෙවා තිබුණු බව නිරික්ෂණය විය.

(ඇ) ගඟඉහළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හැරකොළ ග්‍රාම නිලධාරි වසමේ අංක 142/1 B, ගම්පොල දරන ලිපිනයේ පදිංචි පුද්ගලයෙකු සඳහා මෙම විකල්ප අවස්ථාව යටතේ ප්‍රතිලාභ ලබා ගැනීමට තෝරාගෙන තිබූ ඉඩමේ පිහිටි නිවස 2019 පෙබරවාරි 06 දිනැති අංක NBRO/KN/GIK/L1-IRS/19/31/44401 දරන වාර්තාව මඟින් මිලදී ගැනීම සඳහා යෝග්‍ය නොවන බව නිර්දේශ කර තිබුණි.

එම නිර්දේශය සලකා බැලීමකින් තොරව නොසැලකිලිමත් ලෙස 2019 ජුනි 19 දින රු.1,600,000 ක මුදලක් මෙම ප්‍රතිලාභියා වෙත ගෙවා තිබූ අතර,ලබාදුන් මුදලින් රු.700,000 ක් කොටසක් 2019 අගෝස්තු 02 දින නැවත පියවා තිබුණු නමුත් ඉතිරි මුදල විගණිත දින වන විටත් නැවත අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

### 3.2.4.2 ඉඩමක් මිලදීගෙන නිවස ඉදිකිරීම සඳහා මූල්‍යාධාර ලබාදීම.

(අ) මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ 20 ක් තුල ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් අධි අවදානම් ලෙස හඳුනාගත් ප්‍රතිලාභින් 218 දෙනෙකු විසින් මෙම විකල්ප අවස්ථාව යටතේ කටයුතු කිරීම සඳහා කැමැත්ත ප්‍රකාශකර තිබුණු අතර විගණන අවස්ථාව වන විට එක් ප්‍රතිලාභියෙකු පමණක් නව ඉඩමක නිවස ඉදිකර පදිංචි වී තිබුණි.

(ආ) මාර්ගෝපදේශයෙහි පියවර අංක 10.1 අනුව, මිළදී ගන්නා ඉඩමක හෝ තමන් සතු ඉඩමක නිවාස ඉදිකිරීමට අනුමැතිය ලබාගත් ප්‍රතිලාභීන් සඳහා රු. 400,000ක මුදලක් එම ඉඩම මිලදී ගැනීම සඳහා හෝ තමන් සතු ඉඩමක් ඇත්නම් ඒ සඳහා වන්දි මුදලක් සේ ලබාදෙනු ලබයි. කෙසේ වෙතත්, අංක NDRSC/1/2/3/RS දරන 2018 ජනවාරි 08 දිනැති අධ්‍යක්ෂ, ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය විසින් අධ්‍යක්ෂ ජනරාල් , ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය වෙත නිකුත් කර තිබූ ලිපියක් මගින් මාර්ගෝපදේශයෙහි සඳහන් උක්ත පියවර සංශෝධනය කර ඒ සඳහා "නිවස ඉදි කිරීම සඳහා පර්චස් 20ට නොවැඩි ඉඩමක් මිලදී ගැනිම සඳහා රු.400,000 ක මුදලක් ලබාදේ" යනුවෙන් ඇතුලත් කර නව මාර්ගෝපදේශයක් දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත නිකුත් කිරීමට කටයුතු කරන මෙන් ඉල්ලා තිබුණි. එසේ වුවද නව මාර්ගෝපදේශ නිකුත් කර නොතිබුණි.

### 3.2.4.3 රජයේ ඉඩමක් ලබාදී නිවස ඉදිකිරීම සඳහා මූල්‍යාධාර ලබාදීම.

(අ) මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශිය ලේකම් බල ප්‍රදේශ 11 ක් තුල ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් අධි අවදානම් ලෙස හඳුනාගත් ප්‍රතිලාභීන් 258 දෙනෙකු විසින් මෙම විකල්ප අවස්ථාව යටතේ කටයුතු කිරීම සඳහා කැමැත්ත ප්‍රකාශකර තිබුණු අතර විගණන අවස්ථාව වූ 2019 ඔක්තෝබර් 30 වන විට ප්‍රතිලාභීන් කිසිවෙකු රජයේ ඉඩම් තුළ නිවාස ඉදිකිරීම් සම්පූර්ණ කර නොතිබුණි.

(ආ) මෙම වාර්තාවේ ඡේද අංක 3.2.1(ඇ) හි දැක්වෙන පරිදි ඉඩම් තෝරා ගැනීමේ කමිටුවක් හරහා විධිමත් පරිදි ඉඩම් තෝරා නොගැනීම හේතුවෙන් ප්‍රාදේශිය ලේකම්වරුන්ගේ මූලිකත්වයෙන් තෝරාගත් ඉඩම්වල යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ කටයුතු මන්දගාමීව ඉටුවන බව නිරීක්ෂණය විය. තවද, එමඉඩම්සඳහායටිතලපහසුකම් (ප්‍රවේශමාර්ග, ජලය, විදුලිය, කාණුපද්ධති ආදි) කඩිනමින් සංවර්ධනය නොකිරීම හා රජයේ ඉඩම්වල භූමිය මදබෑවුම් සහිත බැවින් නිවාස ඉදිකිරීමේදී පැති බැම් ඉදිකළ යුතු වීම හේතුවෙන් ප්‍රතිලාභීන් බොහෝ විට රජයෙන් ලබාදෙන ඉඩම් කට්ටිවල නැවත පදිංචි වීම ප්‍රතික්ෂේප කර ඇති බව නිරීක්ෂණය විය. උදාහරණ ඇමුණුම 04හි දැක්වේ.

(ඇ) ප්‍රාදේශිය ලේකම් කාර්යාල 13 ක් මඟින් ඇමුණුම 05 හි දැක්වෙන පරිදි මෙම විකල්පය යටතේ රජයේ ඉඩම් හඳුනාගෙන පමණක් තිබූ අතර ගඟඉහළ ප්‍රාදේශිය ලේකම් බලප්‍රදේශය තුළ පමණක් මෙම විකල්ප අවස්ථාව යටතේ මූල්‍ය ප්‍රතිලාභ ලබාදීමේ යම් මට්ටමක ප්‍රගතියක් පැවතුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) ගඟඉහළ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ කුරුදුවත්ත ප්‍රදේශයේ පිහිටි අක්කර 25 ක් වූ ඉඩමෙන් මෙම ව්‍යාපෘතිය යටතේ ප්‍රතිලාභීන් පිරිසක් වෙත ඉඩම් කට්ටි 153 ක් බෙදා දීම සඳහා කටයුතු කර තිබුණ ද. ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් පරීක්ෂා කර නිර්දේශ කර ගැනීමකින් තොරව ප්‍රතිලාභීන් වෙත ඉඩම් කට්ටි බෙදාහැර තිබුණි. පසුව ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් ඉඩම පරීක්ෂා කර 2018 ජූලි 20 දිනැති අංක NBRO/KN/RS/GIK/31/25548/A දරන මූලික භූ සමීක්ෂණ වාර්තාව අනුව ඉන් ඉඩම් කට්ටි 34 ක් නැවත පදිංචි කිරීම සඳහා සුදුසු නොවන බවට නිර්දේශ කර තිබුණි.

(ii) මෙම ඉඩම් කට්ටි 34 ලබාදුන් ප්‍රතිලාභීන් වෙනුවෙන් පළමු වාරිකය ලෙස රු.200,000 ක බැගින් රු.6,800,000 ක් ගෙවා තිබූ නමුත් එකී ප්‍රතිලාභීන් සම්බන්ධයෙන් කිසිදු ඉදිරි ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(iii) නැවත පදිංචි කිරීමේ මාර්ගෝපදේශයෙහි පියවර අංක 06, 07, 08 හා 09 අනුව, ඉදිකිරීම සඳහා භූමිය සකස් කිරීමට සහ මූලික නිවසෙහි අත්තිවාරම නිම කිරීමෙන්පසුව රු.200,000 ක් වූ පළමු වාරිකයමුදාහැරිය යුතු වුවද,නිම නොකර තිබියදී ප්‍රතිලාභීන් 153 ක් (ඉහත ප්‍රතිලාභීන් 34 ද ඇතුළත්ව) වෙත අවස්ථා 03 කදී රු.200,000 ක බැගින්රු.30,600,000 ක් මුදාහැර තිබුණි.

(iv) තවද මෙම පළමු වාරික නිදහස් කිරීමට ප්‍රථම නිවාස සැලසුම් සඳහා අදාළ පළාත් පාලන ආයතනය මඟින් අනුමැතිය ලබාගෙන නොතිබූ අතර, මාර්ගෝපදේශයෙහි "ආකෘතිය 03" යටතේ අධීක්ෂණ පත්‍රිකාව තාක්ෂණික නිලධාරි විසින් සම්පූර්ණ කර ද නොතිබුණි.

### 3.2.5 අධි අවදානම් ප්‍රදේශවල නැවත පදිංචි වීම වැළැක්වීමට පියවර නොගැනීම

--------------------------------------------------------------------------------

(අ) 2017 ජුලි 05 දිනැති අංක අමප/17/1216/715/017 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමත කරන ලද 2017 ජූනි 10 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශ අංක 13/2017 හි 03 ඡේදය අනුව නායයෑම් අධි අවදානම් ප්‍රදේශවල නැවත පදිංචිය වැළැක්වීම සඳහා එම නිවාස හා ඉඩම් රජයට පවරා ගැනීමට තීරණය කර තිබුණි. තවද එම පවරා ගන්නා පර්චස් 20 ට වැඩි නිවාස සහ ඉඩම් තක්සේරු කර එම වටිනාකම වන්දි ලෙස ලබාදීමට තීරණය කර තිබුණි. කෙසේ වෙතත් මෙම තීරණය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කටයුතු වර්තමානය වන තෙක්ම සිදුකර නොමැති බව නිරීක්ෂණය විය.

(ආ) නායයෑම් අධි අවදානම් යටතේ පවතින ඉඩම්වල පදිංචියෙන් ස්ථිර ලෙස ඉවත් කිරීමට හා නැවත පදිංචි කිරීමේ වැඩසටහන යටතේ ආරක්ෂිත ස්ථානවල නිවාස ලබා දුන්නද අධි අවදානම යටතේ පවතින නිවාසයෙන් ඉවත් නොවී තවදුරටත් රැඳීම තුළින් ඇතිවිය හැකි ජීවිත හානි වැළැක්වීම සඳහා නැවත පදිංචි වීම තහනම් කිරීමටත්, එම ඉඩම්, විධිමත් ඉඩම් පරිහරණ සැලසුමක් යටතේ කෘෂි ආර්ථික කටයුතු සඳහා අදාළ ඉඩම් හිමියන්ට පරිහරණය කිරීමට අවසර දීමටත්, නව පනතක් කෙටුම්පත් කිරීම සඳහා වූ 2019 පෙබරවාරි 07 දිනැති අංක 06/2019 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2019 මාර්තු 06 දිනැති අංක අමප/19/0532/120/010 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලැබී තිබූ නමුත් මේවන තෙක් එකී පනත් කෙටුම්පත සකස්වී නොතිබුණි.

(ඇ) ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් නායයෑම් අධි අවදානම් ලෙස හඳුනා ගන්නා ලද නිවාස සහ ඉඩම්වල නව ඉදිකිරීම් සිදු කිරීම හෝ ඒවා විකිණීම සිදු කිරීම වැළැක්වීම සඳහා සුදුසු පියවර නොගැනීම හේතුවෙන් පහත උදාහරණ වලින් දැක්වෙන පරිදි මහනුවර දිස්ත්‍රික්කය තුළ එම නිවාස නැවත අළුත්වැඩියා කිරීම්, නවීකරණය කිරීම් හා විකිණීම වැනි අවස්ථා පැවතුණි.

i පාතදුම්බර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් 2016 වර්ෂයේදී අංක 31/21657 දරන වාර්තාව මඟින් නායයෑම් අධි අවදානම් ලෙස හඳුනාගන්නා ලද යටිරාවන ග්‍රාම නිලධාරි වසමේ පදිංචි පුද්ගලයෙකු සතු නිවස සහ

ඉඩමෙහි ඉදිරිපස කොටස කොන්ක්‍රීට් කණු සහ ස්ලැබ් යොදාවිශාල මුදලක් දරා සකස් කර තිබුණි. තවද, මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නායයෑම් අධි අවදානම් ලෙස හඳුනාගන්නා ලද පුද්ගලික නිවසක් සහ ඉඩම වෙනත් පුද්ගලයෙකු වෙත විකුණා තිබුණි.

ii කුණ්ඩසාලේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය තුළ ගල්පිහිල්ල පන්විල ප්‍රදේශයේ නායයෑම් අධි අවදානම් ලෙස හඳුනාගනු ලැබූ ඉඩම් හා නිවාස ආශ්‍රිතව පිහිටා ඇති ඉඩම් කොටසක් වෙනත් පුද්ගලයෙකු වෙත 2017 ජූනි 23 දින විකුණා තිබූ අතර, අදාළ ඉඩමට ඉහළින් ඇති නායයෑම් අවදානම් සහිත කඳු බෑවුමෙන් මෙම ඉඩම වෙතද බලපෑමක් එල්ල විය හැකි බව භෞතික පරික්ෂාවේදී නිරික්ෂණය විය. තවද, මෙම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් 2016 වර්ෂයේදී අංක 31/27880 දරන වාර්තාව මඟින් නායයෑම් අධි අවදානම් ලෙස හඳුනාගන්නා ලද අලවතුගිරිගම පදිංචි පුද්ගලික නිවසක අළුතින් කොටස් ඉදිකර ද තිබුණි.

iii පස්බාගේ කෝරළේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් 2014 වර්ෂයේදී නායයෑම් අධි අවදානම් ලෙස හඳුනාගන්නා ලද පුද්ගලික නිවසක නව කාමර ඉදිකොට අළුත්වැඩියා කර තිබුණි.

iv පන්විල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ තවලම් තැන්න ග්‍රාම නිලධාරි වසමේ අංක 54/1 ගෝමර ජනපදය, පහළ කොටසේ පදිංචි පුද්ගලයෙකුගේ නිවස සම්බන්ධයෙන් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් නිකුත් කරන ලද අංක NBRO/LI/PAN/KN/18/31/13136 දරන 2018 මැයි 23 දිනැති භූ සමීක්ෂණ වාර්තාවට අනුව පාෂාණ පෙරලීමේ අවධානම හේතුවෙන් පදිංචියෙන් ඉවත් කොට වෙනත් සුදුසු භූමියක පදිංචි කරවීම කළ යුතු බවට නිර්දේශ කර තිබුණ ද, මෙම පුද්ගලයා විසින් ඔහු පදිංචිවී සිටි අවදානම් ස්ථානයේ පිහිටි පැරණි නිවස ආසන්නයේ නව නිවසක් පසුව ඉදිකර තිබුණි. ඡායාරූප පහත දැක්වේ.



v උඩුදුම්බර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ නායයෑම් අධි අවදානම් ස්ථානයක ජීවත්වන පුද්ගලයෙකු තම නිවස අධික වියදමක් දරමින් ඉදිකරගෙන තිබීම හේතුවෙන් එම පුද්ගලයා වෙනත් ස්ථානයක නැවත පදිංචිය සඳහා යාමට අකමැත්ත ප්‍රකාශ කර තිබුණි. ඡායාරූප පහත දැක්වේ.





### 3.3 ව්‍යාපෘතියේ ප්‍රගතිය

--------------------

2017 ජූලි 31 දින සිට මහනුවර දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කරන ලද නැවත පදිංචි කිරීමේ ව්‍යපෘතියෙහි ප්‍රගතිය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.


#### 3.3.1 අරමුදල් උපයෝජනය

------------------------

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2018 වර්ෂය සහ 2019 වර්ෂයේ ඔක්තෝබර් වන විට මහනුවර දිස්ත්‍රික්කය සඳහා පිළිවෙලින් රු.95,631,552 ක සහ රු.156,400,000 ක ප්‍රතිපාදන ආපදා කළමනාකරණ අමාත්‍යාංශයෙන් ලබාදී තිබූ අතර,ඉන් පිළිවෙලින් රු.44,429,961 ක් සහ රු.47,148,058 ක් පමණක් උපයෝජනය කර තිබුණි. සමස්ථයක් ලෙස දිස්ත්‍රික්කයේ ප්‍රතිපාදන උපයෝජනය 2018 වර්ෂයේදී සියයට 46 ක් සහ 2019 ඔක්තෝබර් වන විට සියයට 30 ක් වැනි අවම මට්ටමක පැවති අතර, අක් මුදල් නොමැති වීමද ප්‍රගතිය අවම වීමට හේතුවක් වී තිබුණි. විස්තර ඇමුණුම 06 හි දැක්වේ.

#### 3.3.2 භෞතික ප්‍රගතිය

------------------





යොමුව - වගු අංක 01 (ඇමුණුම 07)

(අ) විගණන පරීක්ෂණ අවස්ථාව වන විට ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් මහනුවර දිස්ත්‍රික්කයේ නායයෑම් අධි අවදානම් ලෙස හඳුනාගනු ලැබූ මුලු ප්‍රතිලාභීන් සංඛ්‍යාව1431වුව ද, ප්‍රස්ථාරයේ දැක්වෙන පරිදි ඉන් ප්‍රතිලාභීන් 1176 ක් සඳහා කිසිදු ප්‍රතිලාභයක් ලබාදී නොතිබුණු අතර ප්‍රතිලාභීන් 255 දෙනෙකුට පමණක් ව්‍යාපෘතිය යටතේ ප්‍රතිලාභ ලබාදී තිබුණි. ප්‍රතිශතයක් ලෙස ගත්විට එය සියයට18 ක් වැනි අවම අගයක් ගෙන තිබුණි.

(ආ) ප්‍රතිලාභ ලබාදී තිබූ 255 දෙනා පිළිබඳ සැලකීමේදී ඉන් ප්‍රතිලාභීන් 104දෙනෙකු විගණන අවස්ථාව වන විටත් ව්‍යාපෘතියේ මූලික අවස්ථාව වන නැවත පදිංචි වීම සඳහා ඉඩමක් පමණක් හිමිකරගෙන තිබුණු අතර ප්‍රතිලාභීන් 105 දෙනෙක් ඉඩම සහ පළමු වාරිකයද, ප්‍රතිලාභීන් 24දෙනෙක් ඉඩම හාපළමුසහදෙවන වාරිකද, ප්‍රතිලාභීන් 15 දෙනෙක් ඉඩම හා පළමු, දෙවන සහ තෙවන වාරිකද ලබාගෙන නිවාස ඉදිකරමින් පැවතුණි.

(ඇ) මෙහිදි, ප්‍රතිලාභීන් 07 දෙනෙක් සඳහා පමණක් මෙම ව්‍යාපෘතිය යටතේ සියලු ප්‍රතිලාභ ලබාදී වෙනත් සුරක්ෂිත ස්ථානයක නැවත පදිංචි කිරීමට කටයුතු කර තිබුණි. එය මුලු ප්‍රතිලාභීන් අතරින් සියයට 0.5 ක් වැනි අවම ප්‍රතිශතයක් වී තිබුණි.

(ඈ) මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශිය ලේකම් කාර්යාල මට්ටමින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පහත පරිදි විය.




යොමුව - වගු අංක 02 (ඇමුණුම 8)

(ඉ) විගණන අවස්ථාව වන විටත් පහත සඳහන් ප්‍රදේශීය ලේකම් කොට්ඨාශ 05 ට අදාළව හඳුනා ගනු ලැබූ කිසිදු ප්‍රතිලාභියෙකුහට සහන සැලසීමට නොහැකි වී තිබුණි.

| | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | හඳුනාගෙන ඇති ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|
| i. | ගඟවට කෝරළය | 123 |
| ii. | පූජාපිටිය | 44 |
| iii. | දෙල්තොට | 36 |
| iv. | පන්විල | 7 |
| v. | යටිනුවර | 28 |

(ඊ) විකල්ප අවස්ථා යටතේ ලියාපදිංචි වී තිබුණද දීර්ඝ කාලයක් තිස්සේ ප්‍රතිලාභීන් විසින් ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබූ අවස්ථා නිරීක්ෂණය වූ අතර, ඒ සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් පසුවිපරම් කිරීමක් සිදුවී නොතිබුණි. උදාහරණ ඇමුණුම 9 හි දැක්වේ.

### 3.3.3 ප්‍රතිලාභීන්ගේ ජීවන තත්ත්වය

(අ) ව්‍යාපෘතිය යටතේ නැවත පදිංචි කිරීමේ කටයුතු ප්‍රමාද වීම හේතුවෙන් නායයෑම් අධි අවදානම් සහිත ස්ථානවල ජීවත්වන පුද්ගලයින්ගේ ජීවන තත්ත්වය කෙරෙහි අහිතකර බලපෑම් ඇතිවී තිබුණි. නිදසුන් වශයෙන් මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 02 කට අයත් ප්‍රතිලාභින් 18 දෙනෙක් තම ස්ථිර පදිංචියෙන් ඉවත් වී තාවකාලිකව ඥාති නිවෙස්වල, කුලී නිවෙස්වල හෝ වෙනත් තාවකාලික ගොඩනැගිලිවල ජීවත්වන බව නිරීක්ෂණය විය. විස්තර ඇමුණුම 10හි දැක්වේ.

(ආ) පස්බාගේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ 2014 වර්ෂයේදී ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් නායයෑම් අධි අවදානම් සහිත භූමි ප්‍රදේශයක් ලෙස හඳුනාගත් සෝලංකන්ද ප්‍රදේශයේ නිවාස 20 ක පුද්ගලයින් 2019 ඔක්තෝබර් 21 විගණන දින වන විටත් එම ස්ථානවලම පදිංචි වී සිටින බව නිරීක්ෂණය විය. භෞතික පරික්ෂණයයේදී නිවාසවල විශාල ප්‍රමාණයෙන් පුපුරා යාම්, ඉරිතැලීම්, ගිලාබැසීම් ලක්ෂණ දක්නට තිබු අතර, ලැබි ඇති තොරතුරු අනුව මෙම පවුල් අධික වර්ෂා කාලයේදී තාවකාලික කඳවුරුවල රඳවා තැබීමට කටයුතු කරන බව නිරීක්ෂණය විය.

(ඇ) ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් මහනුවර දිස්ත්‍රික් නගර සීමාව තුල හා ඒ ආශ්‍රිතව අධි අවදානම් පදිංචිකරුවන් ලෙස හඳුනාගෙන ඇති පුද්ගලයින් නගරාශ්‍රිත පදිංචියෙන් ඉවත් වීමට අකමැති වීම හේතුවෙන් එම ප්‍රදේශවල ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීමේ ප්‍රගතිය අවම වී තිබුණි. නගරාශ්‍රිත ඉඩම් මිල ගණන් ඉහල අගයක් පැවතීම සහ නාගරික පහසුකම් සහිත නව ඉඩම් සොයාගැනීමට අපහසු වීම හේතුවෙන් මෙම තත්ත්වය ඇතිවී තිබුණි.

### 3.3.4 වෙනත් නිරීක්ෂණ

(අ) ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් හඳුනාගනු ලැබූ මහනුවර දිස්ත්‍රික්කයේ වතු ඉඩම්වල නායයෑම් අධි අවදානම් ස්ථානවල ඇති වතු නිවාස 648 ක් * (ඇමුණුම 03) සඳහා මෙම ව්‍යාපෘතිය යටතේ නැවත පදිංචි කිරීමේ කටයුතු සිදු නොකරන බව නිරීක්ෂණය විය. ඒ අනුව එම වතු පවුල් වර්තමානය වන විටත් නායයෑම් අධි අවදානම් ස්ථානවලම තවදුරටත් පදිංචි වී සිටි.

* වතු නිවාස පේළි අංක පමණක් NBRO වාර්තාවල සඳහන් වීම හේතුවෙන් නිවාස ගණන වැඩිවිය හැක.

(ආ) වෙනත් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන මඟින් වතු ආශ්‍රිතව නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල දැනුවත් නොවීම හා අදාල වතු නිවාස සම්බන්ධයෙන් නැවත පදිංචි කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක වීම සම්බන්ධව මාර්ගෝපදේශය තුලද පැහැදිලි සටහනක් නොමැති බැවින් ඒ සම්බන්ධයෙන් කටයුතු සිදු කිරීම ගැටළු සහගත වී තිබුණි.

(ඇ) දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් හඳුනාගනු ලැබූ නායයෑම් අධි අවදානම් ස්ථානවල පිහිටා ඇති වතු නිවාස 50 ක ජීවත්වන පවුල් වෙනත් ස්ථානයක නැවත පදිංචි කිරීමේ ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා 2017 ජනවාරි 17 හා 2018 ජූනි 05 දිනැති ලිපි මඟින් වතු පාලන අධිකාරිය වෙත අවස්ථා 02 කදී දැනුම්දී තිබුණු නමුත් ඒ සඳහා විගණිත දිනවන 2019 ඔක්තෝබර් 02 දිනවන විටත් ප්‍රතිචාර දක්වා නොතිබුණි.

(ඈ) උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් හඳුනාගනු ලැබූ ඉඩම් හා නිවාස 12 ක ප්‍රතිලාභීන්ට එම අවදානම් සහිත ඉඩම්වලට ඔප්පු/හිමිකම් සහතික/බලපත්‍ර නොමැති වීම හේතුවෙන් ව්‍යාපෘතිය යටතේ ප්‍රතිලාභ සැලසීම සිදුකිරීමට නොහැකි වී තිබුණි. මෙහිදී එවැනි අවස්ථාවල විකල්ප ක්‍රමවේදයක් යටතේ ස්ථිර පදිංචිය තහවුරු කරගෙන මෙම ව්‍යාපෘතිය යටතේ සහන සැලසීමට ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි. එම පුද්ගලයින් පිළිබඳ විස්තර ඇමුණුම 11 හි දැක්වේ.

(ඉ) ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් මූලික භූසමීක්ෂණ වාර්ථා මඟින් අධිඅවදානම් ලෙස නම්කරනලද පුද්ගලයින් එම ආයතනයෙන් මෙම ව්‍යාපෘතිය සඳහා යොදා ගැනීමට නිර්දේශ කර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට දෙනු ලබන සාරාංශ ලේඛනවල නොතිබුණු අවස්ථා පැවතුණි.

නිදසුන් වශයෙන් :- අංක NBRO/KW/GIK/104 හා 2014 දෙසැම්බර් 04 දිනැති ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධාන වාර්තාව අනුව නායයාම් අවදානම අධික බවට හඳුනාගත් ගඟඉහළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රතිලාභීන් දෙදෙනෙකු ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය විසින් මෙම ව්‍යාපෘති සඳහා යොදා ගැනීමට නිර්දේශ කර දෙනු ලබන නායයාම් අධි අවදානම් සහිත පුද්ගලයින්ගේ යාවත්කාලීන කරනු ලබන ලේඛනවල නොමැති බව නිරීක්ෂණය විය.

## 4. නිර්දේශයන්

-------------

**4.1** 1:10000 පරිමාණයේ සිතියම්කරන කටයුතු කඩිනම් කිරීම.

**4.2** ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය සකස් කරමින් පවතින දත්ත පද්ධතිය සමඟ දිස්ත්‍රික් ලේකම් කාර්යාල වලට සහ ප්‍රාදේශිය ලේකම් කාර්යාල වලට සම්බන්ධ වීමට හැකි පරිදි ක්‍රමවේදයක් ඇති කිරීම හෝ සම්පූර්ණ කර ඇති දත්ත පද්ධති එම කාර්යාල වලට ලබාදීම.

**4.3** ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය සකස් කර ඇති සංයුක්ත/ ක්‍රියාකාරි සැලසුම්වලට නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතියේ ක්‍රියාත්මක මට්ටම සඳහා වූ ක්‍රමෝපායන් (Strategy) සහ වැඩසටහන් (Program)ඇතුළත් කිරීම.

**4.4** ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ආයතන සම්බන්ධීකරණය සහ මූල්‍ය ප්‍රතිපාදනය උපයෝජනය සඳහා ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය මඟින් සංයුක්ත සැලැස්මක් හා වාර්ෂික ක්‍රියාකාරි සැලසුම් සකස් කිරීම.

**4.5** විවිධ රාජ්‍ය ආයතනවල අතිරික්තව සිටින සංවර්ධන නිලධාරින් ආපදා සහන සේවා නිලධාරින් ලෙස අනුයුක්ත කිරීම මඟින් පවතින මානව සම්පත් හිඟයට විසඳුම් ලබාදීම.

**4.6** මාර්ගෝපදේශයේ සඳහන් පරිදි ක්‍රියාකාරී කමිටුව, ප්‍රතිලාභින් තෝරා ගැනීමේ කමිටුව, පැමිණිලි හා අභියාචනා විභාග කිරීමේ කමිටුව සහ ඉඩම් තෝරා ගැනීමේ කමිටුව ස්ථාපිත කර නිශ්චිත කාල පරාසයක් තුළ ක්‍රියාකාරීව පැවැත්වීම.

**4.7** ප්‍රාදේශිය ලේකම් කාර්යාල මට්ටමින් ප්‍රතිලාභින් සහ ආපදා සහන සේවා නිලධාරින් දැනුවත් කිරීමේ වැඩසටහන් යාවත්කාලිනව ක්‍රියාත්මක කිරීම.

**4.8** ලබාදුන් ප්‍රතිලාභ උපයෝජනය සම්බන්ධයෙන් පසුවිපරම් කටයුතු යාවත්කාලීනව සිදුකිරීම.

**4.9** අධි අවදානම් ප්‍රදේශවල නැවත පදිංචි වීම වැළැක්වීම සඳහා 2019 මාර්තු 06 දිනැති අංක අමප/19/0532/120/010 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි පනත් කෙටුම්පත සකස් කිරීම කඩිනම් කිරීම.

**4.10** ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් පෙර සවි ආපදා ප්‍රත්‍යස්ථික නිවාස 10000 ක් ඉදිකිරීම සඳහා 2018 ඔක්තෝබර් 03 දිනැති අංක අමප/18/2120/823/022/TBR දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් තීරණය කොට 2019 ඔක්තෝබර් 10 දිනැති අංක අමප/19/2634/120/024-I දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව කලුතර හා රත්නපුර දිස්ත්‍රික්කවල නියමු ව්‍යාපෘතියක් ලෙස මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතින බැවින් මහනුවර දිස්ත්‍රික්කයේ නැවත පදිංචි කිරීම් කටයුතු වඩාත් කඩිනමින් ඉටු කිරීම සඳහාද රාජ්‍ය මැදිහත් වීමෙන් නිවාස ඉදිකරදීමේ ව්‍යාපෘතියක් හෝ නිවාස සංකීර්ණ ඉදිකිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම.

**4.11** රජයේ ඉඩම් / නැවත පදිංචි කිරීමට තරම් ප්‍රමාණවත් හා සුදුසු ඉඩම් නොමැති සහ නගරාශ්‍රිත ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශ සඳහා විකල්ප අවස්ථාවක් ලෙස මහල් නිවාස යෝජනා ක්‍රම ඉදිරිපත් කිරීම.

**4.12** මේ වන විට හඳුනාගෙනඇති රජයේ ඉඩම්වල සමෝච්ඡ රේඛා සිතියම් සකස්කර ක්‍රමානුකූලව යටිතල පහසුකම් ඇති කිරීම සඳහා කඩිනම් පියවර ගැනීම හා ඒ සඳහා ප්‍රමාණවත් මූල්‍ය ආධාර වෙන් කිරීමට තුළින් ජීවන තත්ත්වයේ උසස්වීමක් සහිතව රජයේ ඉඩම් තුළ පදිංචි වීමට අවකාශ සලසාදීම.

**4.13** අධි අවදානම් ස්ථානවල ඇති වතු නිවාස සම්බන්ධයෙන් මෙම ව්‍යාපෘතිය යටතේ අවදානය යොමුකර විකල්ප අවස්ථාවන් සලසාදීම.

ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න
විගණකාධිපති

2020 ඔක්තෝම්බර් 31 දින

ඇමුණුම 01

ඡේදයට යොමුව 3.1.2 (ආ)

2019 නොවැම්බර් 30 දින වන විට ගොඩනැගිලි සමීක්ෂණ වාර්තා නිමකර ලබාදීම පිළිබඳ ප්‍රගතිය

---

| ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය | ප්‍රගතිය අවම මට්ටමක පැවති ග්‍රාම නිලධාරි වසම | ලබාදිය යුතු සමීක්ෂණ වාර්තා සංඛ්‍යාව | සම්පූර්ණ කර ලබාදී ඇති සමීක්ෂණ වාර්තා සංඛ්‍යාව | ප්‍රගතිය |
|---|---|---|---|---|
| දොළුව | දොළුව | 88 | 45 | 51% |
| | ගොඩවෙල | 152 | 71 | 47% |
| | මෙගොඩ කළුගමුව | 101 | 30 | 30% |
| හාරිස්පත්තුව | හල්ඔළුව | 134 | 11 | 8% |
| | හල්ඔළුව පල්ලේගම | 117 | 41 | 35% |
| | පහළ දූල්වල | 170 | 42 | 25% |
| | රුවන් පුරය | 90 | 0 | 0% |
| | උඩදූල්වල | 121 | 25 | 21% |
| | යටිඋඩගම | 188 | 90 | 48% |
| උඩුනුවර | අලන්දුවක | 16 | 06 | 38% |
| | අළුත්කන්ද | 04 | 0 | 0% |
| | දෙහිපාගොඩ - නැගෙනහිර | 77 | 12 | 16% |
| | දෙහිපාගොඩ - බටහිර | 23 | 0 | 0% |
| | දෙල්ගහපිටිය | 41 | 0 | 0% |
| | ගඩලාදෙණිය - දකුණ | 02 | 0 | 0% |
| | ගෙලිඔය | 32 | 0 | 0% |
| | ගොඩපල බටහිර | 01 | 0 | 0% |
| | හිද්දඋල බටහිර | 04 | 0 | 0% |
| | කුඹුරදෙණිය | 01 | 0 | 0% |
| | කැටකුඹුර | 03 | 0 | 0% |
| | ලහාමුව | 01 | 0 | 0% |
| | නිකහැටිය | 04 | 0 | 0% |
| | පෙතියාගොඩ - නැගෙනහිර | 08 | 0 | 0% |

| | | | | |
|---|---|---|---|---|
| උඩුනුවර | පොල්ගහඅංග | 15 | 08 | 53% |
| | වීරවිල - බටහිර | 24 | 02 | 8% |
| | | | | |
| යටිනුවර | බුළුමුල්ල | 42 | 23 | 55% |
| | දෙහිදෙනිය - නැගෙනහිර | 34 | 21 | 62% |
| | දෙහිගම - නැගෙනහිර | 162 | 76 | 47% |
| | ගන්නෝරුව - මධ්‍යම | 330 | 30 | 9% |
| | ගන්නෝරුව - නැගෙනහිර | 367 | 140 | 38% |
| | ගන්නෝරුව - බටහිර | 331 | 75 | 23% |
| | ගිරාගම | 31 | 10 | 32% |
| | ගෝවින්දල | 02 | 0 | 0% |
| | කරුවලවත්ත | 104 | 69 | 66% |
| | කැටකුඹුර | 03 | 0 | 0% |
| | කිරිබත්කුඹුර - නැගෙනහිර | 56 | 18 | 32% |
| | මැදරන්ගොඩ | 11 | 0 | 0% |
| | මංගලගම | 90 | 0 | 0% |
| | මොලදණ්ඩ | 38 | 04 | 11% |
| | පෙලාව ඉහළගම | 95 | 60 | 63% |
| | පෙලාව ඉහළමැද | 137 | 60 | 44% |
| | පෙලාව පහලගම | 105 | 31 | 30% |
| | පිළපිටිය | 277 | 44 | 16% |
| | සූරියගොඩ | 216 | 50 | 23% |
| | වෙරළුගොල්ල | 53 | 30 | 57% |
| | | | | |
| ගඟවට කෝරළේ | අම්පිටිය උඩගම - උතුර | 35 | 17 | 49% |
| | අම්පිටිය උඩගම - දකුණ | 60 | 12 | 20% |
| | බහිරව කන්ද | 27 | 02 | 7% |
| | බෝවල | 06 | 0 | 0% |
| | ගුරුදෙණිය - බටහිර | 04 | 0 | 0% |
| | මහවැලි උයන | 25 | 0 | 0% |
| | මල්වත්ත | 215 | 40 | 19% |
| | මාපනාවතුර | 78 | 20 | 26% |
| | පහළ ඊරියගම | 05 | 0 | 0% |
| | වට්ටාරන්තැන්න | 06 | 0 | 0% |

ඇමුණුම 02

ඡේදයට යොමුව 3.2.1 (ආ) (iv)

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් හඳුනාගත් බවට සාක්ෂි නොමැති ප්‍රතිලාභීන්

| ප්‍රතිලාභියාගේ නම | ගෙවා ඇති ප්‍රතිලාභ |
|---|---|
| | රු. |
| කේ.පී.අයි.එල්.උදය කුමාර මයා | 200,000 |
| ඩබ්.එල්.ජගත් ප්‍රියන්ත මයා | 200,000 |
| ශ්‍රියානි මල්ලිකා මිය | 200,000 |
| කේ.ඩබ්.සරත් රණසිංහ මයා | 200,000 |
| කුමාරසිරි අමරතුංග මයා | 200,000 |
| එච්.ජී.ලීල්කාන්ත මයා | 200,000 |
| එල්.ජී.විමලාවති මිය | 200,000 |
| එස්.ජේ.යූ.හෙට්ටිආරච්චි මයා | 200,000 |
| ඩබ්.ජී.යූ.එන්.ජයවර්ධන බණ්ඩාර මයා | 200,000 |
| එම්.ජී.ජිනසේන මයා | 200,000 |
| රෙජිනෝල්ඩ් අතපත්තු මයා | 200,000 |
| ජේ.පී.සිරිමාවති මිය | 200,000 |
| ආර්.පී.රන්තිලක මයා | 200,000 |

ඇමුණුම 03

ඡේදයට යොමුව 3.2.2 (අ) , 3.3.4 (අ)

| ප්‍රා.ලේ.කො. නම | ප්‍රතිලාභින් ගණන (අධි අවදානම් ලෙස NBRO විසින්හඳුනාගෙන ඇතිසංඛ්‍යාව) | | ආකෘතිය අනුව ලියාපදිංචි සංඛ්‍යාව | රජයේ ඉඩමක් ලබාදී නිවසඉදිකිරීම | ඉඩමක් මිලදිගෙන හෝ තමන් සතුඉඩමක නිවස ඉදිකිරීම | ඉඩමක් සමඟ නිවසක් මිලට ගැනීම | ඉවත් වීම් | | | | | ඉවත් වීම් එකතුව | ඉතිරි | ප්‍රතිලාභ ලැබිය යුතුගණන |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ග්‍රාමීය | වතු | | | | | වෙනත් ව්‍යාපෘති | පෞද්ගලික වියදමින් | වෙනත් ප්‍රදේශය කට යාම | මිය යාම | වෙනත් හේතු | | | |
| අකුරණ | 14 | - | | - | 14 | - | - | - | - | - | - | - | - | 14 |
| දෙල්තොට | 38 | 54 | | 31 | - | - | 2 | - | - | - | - | 2 | 5 | 36 |
| දොළුව | 40 | 25 | 28 | 15 | 11 | 2 | - | - | - | - | - | - | 12 | 40 |
| ගඟ ඉහළ කෝරළේ | 264 | 36 | 153 | 112 | 3 | 4 | - | - | - | - | - | - | 145 | 264 |
| හාරිස්පත්තුව | 54 | - | 43 | 8 | 23 | 12 | - | - | - | - | 1 | 1 | 10 | 53 |
| හතරලියද්ද | 45 | - | 26 | - | 27 | - | 6 | - | - | - | 1 | 7 | 11 | 38 |
| ගඟවට කෝරළේ | 124 | - | | - | - | - | - | - | - | - | 1 | 1 | 123 | 123 |
| කුණ්ඩසාලේ | 52 | - | | 11 | 5 | - | 9 | - | - | - | - | 9 | 27 | 43 |
| මැදදුම්බර | 122 | 62 | | - | 58 | 2 | - | - | 2 | - | | 2 | 60 | 120 |
| මිනිපේ | 29 | - | | - | - | 1 | - | - | - | - | | - | 28 | 29 |
| පන්විල | 7 | 276 | | - | 1 | - | - | - | - | - | | - | 6 | 7 |

| | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| පස්බාගේ කෝරළේ | 55 | 29 | 51 | 37 | 14 | - | - | - | - | 1 | 2 | 3 | 1 | 52 |
| පාතදුම්බර | 30 | - | 21 | 9 | 10 | 2 | - | - | - | - | | - | 9 | 30 |
| පාතහේවාහැට | 112 | 98 | 5 | - | 3 | 2 | - | - | - | - | | - | 107 | 112 |
| පූජාපිටිය | 44 | - | | - | 14 | - | - | - | - | - | | - | 30 | 44 |
| තුම්පනේ | 38 | - | 6 | 4 | 2 | 1 | - | - | 2 | - | 1 | 3 | 28 | 35 |
| උඩදුම්බර | 147 | - | | 1 | 4 | 2 | - | 16 | 3 | - | | 19 | 121 | 128 |
| උඩපළාත | 132 | 55 | 59 | 29 | 11 | - | - | - | - | - | | - | 92 | 132 |
| උඩුනුවර | 103 | 13 | | 1 | 18 | - | - | - | - | - | | - | 84 | 103 |
| යටිනුවර | 28 | - | | - | - | - | - | - | - | - | | - | 28 | 28 |
| එකතුව | 1478 | 648 | 392 | 258 | 218 | 28 | 17 | 16 | 7 | 1 | 6 | 47 | 927 | 1431 |

ඇමුණුම 04

ඡේදයට යොමුව 3.2.4.3 (ආ)

| ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය | ඉඩමේ නම | භෞතික තත්ත්වය |
| --- | --- | --- |
| උඩුනුවර | ගෝනාදිකවත්ත | ජල සම්පාදන දෙපාර්තමේන්තුවේ නල ජල මාර්ග ඉඩමට ලබා ගැනීමට නොහැකි වී ඇත.<br><br>ඉඩමට ප්‍රවේශ මාර්ගය පැවතුණද ඉඩම් කට්ටි සඳහා විධිමත් පරිදි සකසන ලද ප්‍රවේශ මාර්ග නොමැත. |
| කුණ්ඩසාලේ | අහස්පොකුණ<br><br>ගෝනවල දකුණ | ඉඩමට ප්‍රවේශ මාර්ගය පැවතුණද ඉඩම් කට්ටි සඳහා විධිමත් පරිදි සකසන ලද ප්‍රවේශ මාර්ග නොමැත. |

ඇමුණුම 05

ඡේදයට යොමුව 3.2.4.3 (ඇ)

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ඉඩමේ නම |
| --- | --- |
| -------------------- | -------------- |
| ගඟඉහළ කෝරළේ | කුරුදුවත්ත මල්වත්ත ග්‍රාම නිලධාරි වසම |
| කුණ්ඩසාලේ | අහස් පොකුණ - ගෝනවල දකුණ |
| පාතදුම්බර | කෙහෙලියගම - හාමින්දාගොඩ |
| යටිනුවර | කිරිමැටියාවත්ත |
| උඩුනුවර | ගෝනාධිකවත්ත |
| දොළුව | පුපුරැස්ස - ඩේසන් වත්ත |
| පාතහේවාහැට | අම්බලන්මාන වත්ත |
| දෙල්තොට | ගෝනංගොඩ |
| මැදදුම්බර | අඟුරුගමවත්ත ( ග්‍රාම නිලධාරි වසම B18.බඹරමහදෙනිය) |
| මිණිපේ | උඩත්තව ගොවි ගම්මානයේ ඉඩමක් |
| හාරිස්පත්තුව | පලාගලවත්ත - ඕවතැන්න |
| උඩපළාත | සොගමාවත්ත සහ නයාපාන වත්ත |
| පස්බාගේ | ඉඹුල්පිටිය - මැදගහවතුර ඉඩම |

ඇමුණුම 06

ඡේදයට යොමුව 3.3.1

නැවත පදිංචි කිරීමේ ව්‍යපෘතිය සඳහා ප්‍රතිපාදන ලබාදීම

---

2018 වර්ෂය (වැය විෂය අංකය - 106-2-4-12-2202/106-2-4-13-2202)

දිස්ත්‍රික්කය සඳහා ලබාදුන් සමස්ථ ප්‍රතිපාදන මුදල රු.95,631,551.56

| ප්‍රාදේශියලේකම් කොට්ඨාශය | ලබාදුන් ප්‍රතිපාදන | වියදම | ඉතිරි ප්‍රතිපාදන | ප්‍රතිපාදන උපයෝජනයේ ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | |
| ගඟවටකෝරළය | | | | |
| කුණ්ඩසාලේ | | | | |
| පාතදුම්බර | | | | |
| පන්විල | | | | |
| යටිනුවර | | | | |
| උඩුනුවර | 31,200,000.00 | 400,000.00 | 30,800,000.00 | 1% |
| උඩපළාත | 1,000,000.00 | 1,000,000.00 | | 100% |
| දොළුව | 19,200,000.00 | | 19,200,000.00 | 0% |
| පාතහේවාහැට | | | | |
| දෙල්තොට | | | | |
| මැදදුම්බර<br>උඩුදුම්බර | 5,300,000.00 | 4,100,000.00 | 1,200,000.00 | 77% |
| මිණිපේ | 1,600,000.00 | 1,600,000.00 | | 100% |
| අකුරණ | | | | |
| පූජාපිටිය | | | | |
| හාරිස්පත්තුව | | | | |
| තුම්පනේ | | | | |
| හතරලියද්ද | | | | |
| ගඟඉහළකෝරළේ<br>පස්බාගේකෝරළේ | 37,331,551.56 | 37,329,960.88 | 1,590.68 | 100% |
| එකතුව | 95,631,551.56 | 44,429,960.88 | 51,201,590.68 | 46% |

ඇමුණුම 06

ඡේදයට යොමුව 3.3.1

2019 (වැය විෂය අංකය -130-2-8-12-2202)

දිස්ත්‍රික්කය සඳහා ලබාදුන් සමස්ථ ප්‍රතිපාදන මුදල රු.156,400,000

| ප්‍රාදේශියලේකම් කොට්ඨාශය | ලබාදුන් ප්‍රතිපාදන | වියදම | ඉතිරි ප්‍රතිපාදන | ප්‍රතිපාදන උපයෝජනයේ ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | |
| ගඟවටකෝරළය | | | | |
| කුණ්ඩසාලේ | | | | |
| පාතදුම්බර | 2,400,000.00 | | 2,400,000.00 | 0% |
| පන්විල | | | | |
| යටිනුවර | | | | |
| උඩුනුවර | 2,200,000.00 | 1,600,000.00 | 600,000.00 | 73% |
| උඩපළාත | 4,245,000.00 | 1,200,000.00 | 3,045,000.00 | 28% |
| දොළුව | 724,000.00 | 200,000.00 | 524,000.00 | 28% |
| පාතහේවාහැට | 600,000.00 | 400,000.00 | 200,000.00 | 67% |
| දෙල්තොට | | | | |
| මැදදුම්බර | 15,100,000.00 | 9,600,000.00 | 5,500,000.00 | 64% |
| උඩුදුම්බර | 7,500,000.00 | 3,630,000.00 | 3,870,000.00 | 48% |
| මිනිපේ | | | | |
| අකුරණ | 2,400,000.00 | 2,400,000.00 | | 100% |
| පූජාපිටිය | 10,200,000.00 | 400,000.00 | 9,800,000.00 | 4% |
| හාරිස්පත්තුව | 3,600,000.00 | 3,575,000.00 | 25,000.00 | 99% |
| තුම්පනේ | | | | |
| හතරලියද්ද | 4,800,000.00 | 4,800,000.00 | | 100% |
| ගඟඉහළකෝරළේ | 21,543,058.30 | 18,743,058.30 | 2,800,000.00 | 87% |
| පස්බාගේකෝරළේ | 13,056,260.00 | 600,000.00 | 12,456,260.00 | 5% |
| එකතුව | 88,368,318.30 | 47,148,058.30 | 41,220,260.00 | 30% * |

*දිස්ත්‍රික්කය සඳහා ලබාදුන් සමස්ථ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස

ඇමුණුම 07

ඡේදයට යොමුව 3.3.2

වගු අංක - 1

ව්‍යාපෘතියේ ප්‍රගතිය - මහනුවර දිස්ත්‍රික්කය

| ප්‍රා.ලේ.කො. නම | ප්‍රතිලාභ ලැබිය යුතුගණන | ඉඩමක් පමණක් සතු | 1 වාරිකය මට්ටම දක්වා | 2 වාරිකය මට්ටම දක්වා | 3 වාරිකය මට්ටම දක්වා | අවසන් වාරිකය මට්ටම දක්වා | ප්‍රතිලාභ ලබාදුන් ගණන | කිසිදු ප්‍රතිලාභයක්ලබාදී නොමැති ගණන |
|---|---|---|---|---|---|---|---|---|
| අකුරණ | 14 | 0 | 3 | 0 | 0 | 0 | 3 | 11 |
| දෙල්තොට | 36 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 36 |
| දොළුව | 40 | 0 | 1 | 0 | 0 | 0 | 1 | 39 |
| ගඟඉහළ | 264 | 0 | 86 | 21 | 12 | 0 | 119 | 145 |
| හාරිස්පත්තුව | 53 | 2 | 2 | 0 | 0 | 0 | 4 | 49 |
| හතරලියද්ද | 38 | 0 | 7 | 0 | 0 | 0 | 7 | 31 |
| ගඟවටකෝරළේ | 123 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 123 |
| කුණ්ඩසාලේ | 43 | 11 | 0 | 0 | 0 | 0 | 11 | 32 |
| මැදදුම්බර | 120 | 5 | 5 | 2 | 1 | 3 | 16 | 104 |
| මිණිපේ | 29 | 0 | 0 | 0 | 0 | 1 | 1 | 28 |
| පන්විල | 7 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 7 |
| පස්බාගේකෝරළේ | 52 | 37 | 1 | 0 | 0 | 0 | 38 | 14 |
| පාතදුම්බර | 30 | 11 | 0 | 0 | 0 | 0 | 11 | 19 |
| පාතහේවාහැට | 112 | 0 | 0 | 1 | 0 | 0 | 1 | 111 |
| පූජාපිටිය | 44 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 44 |
| තුම්පනේ | 35 | 0 | 0 | 0 | 1 | 0 | 1 | 34 |
| උඩුදුම්බර | 128 | 0 | 0 | 1 | 0 | 2 | 3 | 125 |
| උඩපළාත | 132 | 29 | 1 | 0 | 1 | 0 | 31 | 101 |
| උඩුනුවර | 103 | 9 | 0 | 0 | 0 | 1 | 10 | 93 |
| යටිනුවර | 28 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 28 |
| එකතුව | 1431* | 104 | 106 | 25 | 15 | 7 | 257 | 1174 |

* විවිධ හේතුන් මත ව්‍යාපෘතියෙන් ඉවත් වූ 47 ක් හැර

ඇමුණුම 8

ඡේදයට යොමුව 3.3.2 (ඇ)

වගු අංක - 2

ව්‍යාපෘතියේ ප්‍රගතිය - ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ අනුව

| ප්‍රා.ලේ. කො. නම | ප්‍රතිලාභ ලබාදිය යුතුගණන | ප්‍රතිලාභ ලබාදුන් ගණන |
|---|---|---|
| අකුරණ | 14 | 3 |
| දෙල්තොට | 36 | 0 |
| දොළුව | 40 | 1 |
| ගඟඉහළ | 264 | 119 |
| හාරිස්පත්තුව | 53 | 4 |
| හතරලියද්ද | 38 | 7 |
| ගඟවට කෝරළේ | 123 | 0 |
| කුණ්ඩසාලේ | 43 | 11 |
| මැදදුම්බර | 120 | 16 |
| මිණිපේ | 29 | 1 |
| පන්විල | 7 | 0 |
| පස්බාගේ කෝරළේ | 52 | 38 |
| පාතදුම්බර | 30 | 11 |
| පාතහේවාහැට | 112 | 1 |
| පූජාපිටිය | 44 | 0 |
| තුම්පනේ | 35 | 1 |
| උඩුදුම්බර | 128 | 3 |
| උඩපළාත | 132 | 31 |
| උඩුනුවර | 103 | 10 |
| යටිනුවර | 28 | 0 |

ඇමුණුම 9

ඡේදයට යොමුව 3.3.2 (ඊ)

| ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය | නම | ලියාපදිංචි දිනය |
|---|---|---|
| ------------------ | ------ | ------------ |
| පාතදුම්බර | කේ.ශෂිකුමාර මයා | 2019/01/24 |
| පාතදුම්බර | ඒ.ඕ.ජී.වික්‍රමසිංහ මයා | 2019/01/24 |
| පාතදුම්බර | ඩී.ජී.චන්ද්‍රසිරි මයා | 2019/02/11 |
| යටිනුවර | ඒ.අයි.වි.විජේකෝන් මයා | 2018/11/04 |
| යටිනුවර | බී.එම්.යෝගරත්න මයා | 2018/08/04 |
| යටිනුවර | එස්.එස්.සෙනරත් මයා | 2018/11/25 |
| යටිනුවර | ටි.ජී.ජේ.ඩී.වීරසිංහ මයා | 2018/08/01 |
| යටිනුවර | එච්.එම්.එල්.නවරත්න මයා | 2018/09/27 |
| හාරිස්පත්තුව | එච්.ජී.වික්‍රමසිංහ ජයවීර මයා | 2018/09/16 |
| හාරිස්පත්තුව | ඩික්ෂන් ඇන්තනි මයා | 2018/09/16 |
| හාරිස්පත්තුව | ටී.කේ.ජී.ඥානවතී මිය | 2018/09/16 |
| දොළුව | එම්.ඒ.කේ.චන්ද්‍රාවති මිය | 2017/09/04 |
| දොළුව | ජී.ජී.සුසන්ත වජිර ජයසූරිය මයා | 2017/11/11 |
| හතරලියද්ද | එම්.ජී.ගුණතිලක මයා | 2018/12/01 |
| හතරලියද්ද | කේ.ජී.චිත්‍රා කාන්ති මිය | 2018/11/05 |
| හතරලියද්ද | ටි.ජී.ශාන්ත රණසිංහ මයා | 2018/11/05 |
| හතරලියද්ද | ඩබ්.ජී.රන්කිරා මයා | 2018/11/06 |
| පස්බාගේ කෝරළේ | ජොන් මරියදාස මයා | 2018/10/15 |
| පස්බාගේ කෝරළේ | ජෝසප් ප්‍රනාන්දු මයා | 2018/10/10 |
| පස්බාගේ කෝරළේ | එල්.ආර්.ඩබ්.පෙරේරා මයා | 2019/02/28 |

ඇමුණුම 10

ඡේදයට යොමුව 3.3.3 (අ)

| ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය | නම | භෞතික පරීක්ෂණ අවස්ථාව වන විට පදිංචි ස්ථානය | කාලය |
|---|---|---|---|
| පාතදුම්බර | එම්.ඒ.එෆ්.අශ්‍රෆා මිය | ඥාති නිවසක | 2018 ඔක්තෝබර් සිට |
| පාතදුම්බර | එම්.එම්.රිසාන් මයා | ඥාති නිවසක | 2018 නොවැම්බර් සිට |
| පස්බාගේ කෝරළේ | ආනන්ද හෙට්ටිආරච්චි මයා | කුලී නිවසක | - |
| පස්බාගේ කෝරළේ | ස්ටෙලා මාගරට් මිය | කුලී නිවසක | - |
| පස්බාගේ කෝරළේ | කේ.ජී.විජිත ගමගේ මයා | කුලී නිවසක | - |
| පස්බාගේ කෝරළේ | රාමසාමි කුමාරස්වාමි මයා | කුලී නිවසක | - |
| පස්බාගේ කෝරළේ | ඩබ්.ඒ.එස්.එස්.රණසිංහ මයා | කුලී නිවසක | - |
| පස්බාගේ කෝරළේ | අර්ගජොපේ ප්‍රනාන්දු මයා | කුලී නිවසක | - |
| පස්බාගේ කෝරළේ | මුරුගදාස් සස්තිකා මිය | කුලී නිවසක | - |
| පස්බාගේ කෝරළේ | එච්.එන්.සෝමලතා මිය | ඥාති නිවසක | - |
| පස්බාගේ කෝරළේ | ඩබ්.ඒ.ප්‍රියංකා චාන්දනි මිය | ඥාති නිවසක | - |
| පස්බාගේ කෝරළේ | පීටර් ජෝන් කරොලිනා මිය | ඥාති නිවසක | - |
| පස්බාගේ කෝරළේ | කේ.රාජේන්ද්‍රන් මයා | ඥාති නිවසක | - |
| පස්බාගේ කෝරළේ | කිට්නසාමි ඉනදුසෙල්වම් මයා | රජයේ ගොඩනැගිල්ලක තාවකාලිකව පදිංචිව ඇත | - |

| | | | |
|---|---|---|---|
| පස්බාගේ කෝරළේ | එමලින් බර්නාඩ් මිය | රජයේ ගොඩනැගිල්ලක තාවකාලිකව පදිංචිව ඇත | - |
| පස්බාගේ කෝරළේ | ජේ.ඒ.ආරියදාස මයා | රාජකාරි නිල නිවසේ | - |
| පස්බාගේ කෝරළේ | එස්.ජී.විජේරත්න මයා | එම ඉඩමේම වෙනත් ස්ථානයක තාවකාලිකව පදිංචිව | - |
| පස්බාගේ කෝරළේ | ජේ.අරුලන්දු මයා | තමන් වෙත රජය විසින් මීට ඉහතදී ලබාදුන් ඉඩමක තාවකාලිකව පදිංචි | - |

ඇමුණුම 11

ඡේදයට යොමුව 3.3.4 (ඇ)

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | නම | දිනය |
|---|---|---|
| ------------------ | --------- | ------------- |
| උඩුනුවර | ඒ.එම්.රම්‍යලතා උදයකාන්ති මිය | 2017/10/27 |
| උඩුනුවර | එස්.එම්.බාල බණ්ඩා මයා | 2017/10/12 |
| උඩුනුවර | කේ.අයි.පී.ජී.ජී.බන්දුල මයා | 2017/10/03 |
| උඩුනුවර | එන්.ජී.ජී.එස්.කුමාර මයා | 2017/10/03 |
| උඩුනුවර | එස්.නජිබුන් නිසා මයා | 2017/09/25 |
| උඩුනුවර | ඩබ්.ජී.සුරඟනා මිය | 2017/10/20 |
| උඩුනුවර | දිස්නා රූපිකා මිය | 2017/11/25 |
| උඩුනුවර | බී.එම්.ජයම්පති බණ්ඩා මයා | 2017/11/20 |
| උඩුනුවර | කේ.එම්.පි.බිසෝ මැණිකේ මිය | 2017/11/20 |
| උඩුනුවර | එච්.එම්.පි.කේ.හේරත් මයා | 2017/11/23 |
| උඩුනුවර | එච්.ඒ.සිසිර කුමාර මයා | 2017/10/12 |
| උඩුනුවර | බි.ජී.රත්නවති මිය | 2017/11/20 |